# 2018

## කාර්ය සාධන වාර්තාව
## செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT




දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව

உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை

**Inland Revenue Department - Sri Lanka**

# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ

# කාර්ය සාධන වාර්තාව

# 2018

## නදුන් ගුරුගේ

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2018 වසර තුළ කාර්ය සාධන සාරාංශය

රටේ සංවර්ධනය උදෙසා ආදායම් එක්රැස් කිරීමේ රජයේ අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ සුවිසල් දායකත්වයක් ලබා දෙන ලදී. 2018 වසර තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රැස් කල සමස්ත ආදායම රුපියල් මිලියන 900,348 ක් වූ අතර එය කලින් වසරට වඩා රුපියල් මිලියන 63,830 ක වැඩි වීමක් පෙන්වයි. එමගින් රජයේ සමස්ත ආදායමට සියයට 46.89 ක දායකත්වයක් ලබා දුන් අතර වසර තුළ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය සියයට 6.23 ක් විය.

දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් බදු වර්ග 16 ක් පරිපාලනය කර ඇති අතර පෙර ක්‍රියාත්මකව තිබූ දැනට අවලංගු කර ඇති බදු වර්ග 4 ක් පිළිබඳ කටයුතු සිදු කරන ලදී.

බදු අනුකූලතාවය බලාත්මක කිරීම සහ පහසුකම් සැපයීම යන ද්විත්වයෙන්ම සමන්විත සමෝධානික ක්‍රමවේදය ක්‍රියාත්මක කරලීම සඳහා දේශීය අදායම් නිලධාරීන් 1,132 ක් සහ අනෙකුත් නිලධාරීන් 1,467 ක් සේවයේ යෙදී සිටින ලදී. දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව බදුකරණය සහ ගිණුම්කරණය පිළිබඳ විදෙස් පුහුණු ඇතුලු පුහුණු වැඩසටහන් සහ විභාග ආදිය දේශීය ආදායම් නිලධාරීන් සඳහා දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. මීට අමතරව බදු පිළිබඳ දැනුවත් කිරීම, e - සේවා පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ බදු අනුකූලතා අනුපාතය වැඩි දියුණු කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් සංවිධානය කෙරුණි.

පැහර හරින ලද බදු අය කර ගැනීමේ විශේෂ විධිවිධාන පනතට අතිරේක වශයෙන්, බදු අය කර ගැනීම සඳහා අදාළ ප්‍රඥප්තීන් හි දක්වා ඇති පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග සහ පියවර අඛණ්ඩව ගෙන ඇත.

2018 වර්ෂය තුළ, ගැසට් නිවේදන 16 ක් සහ අර්ථ නිරූපන 9 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත. තොරතුරු අංශය, අනෙකුත් තක්සේරු ඒකක සහ ප්‍රාදේශීය කාර්යාල මගින් ගෙන ඇති ආරම්භක ක්‍රියාමාර්ග හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාණයක බදු ගොනු විවෘත කිරීමට හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලබන සංචාරකයින් විසින් භාණ්ඩ මිලදී ගැනීමේ දී ඒ සඳහා අය කළ එකතු කිරීමේ අගය මත බදු ආපසු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2018 දී සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය අයවැය මගින් යෝජිත පරිදි හඳුන්වා දුනි. වර්ෂය තුළ ආර්ථික සේවා ගාස්තු, මුද්දර ගාස්තු සහ ඔට්ටු හා සූදු බදු හැර අනෙකුත් බදු RAMIS පද්ධතිය හරහා පරිපාලනය කරන ලදී.

.

## දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි බදු හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත්වීම

## මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණ පනත්වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

## උපාය මාර්ගික ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකි වනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම

## ප්‍රධාන නිලධාරීන්

---

**ඒ.එන්. ගුරුගේ මහතා** **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

## නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්

---

| | |
|---|---|
| **ඒ.එන්. ගුරුගේ මහතා** | බදු පරිපාලනය (විශාල සහ මධ්‍ය පරිමාණ සංස්ථාපිත ව්‍යවසායයන්), ආදායම් පුරෝකථන, අධීක්ෂණය, විශේෂ කාර්ය හා පැරණි පද්ධති |
| **පී. රෝහිණී මහත්මිය** | පාරිභෝගික සේවා, අනුකූලතා සහාය සහ ප්‍රවර්ධන |
| **ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය** | ණය කළමනාකරණය, නීති, අභියාචනා සහ විරෝධතා |
| **ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා** | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම (විශාල සහ මධ්‍ය පරිමාණ සංස්ථාපිත ව්‍යවසායයන්) |
| **එම්.ජී. සෝමචන්ද්‍ර මහතා** | බදු ආවේක්ෂණ, තොරතුරු අතුරු මුහුණත, මූල්‍ය බදු පරිපාලනය සහ සරල කරන ලද එකතු කළ අගය මත බදු |
| **සී.එච්. වීරසිංහ මහත්මිය** | මානව ප්‍රාග්ධන සහ වත්කම් කළමනාකරණය |
| **කේ.එස්.බී.ආර්.ඩී.එස්. කරුණාරත්න මහත්මිය** | බදු ප්‍රතිපත්ති, නීති සම්පාදන, රීති නියමයන් සහ අන්තර් ජාතික කටයුතු |
| **ඒ.ඒ. දයාරත්න මහතා (වැඩ බලන)** | බදු පරිපාලනය (සංස්ථාපිත, කුඩා අස්ථාවයන් සහ සංස්ථාපිත නොවන අංශය) |
| **ට්.එස්. ද සොයිසා මහතා (වැඩ බලන)** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පරිපාලනය සහ බදු මෙහෙයුම් සහාය |

## ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්

---

| | |
|---|---|
| එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා | විගණන (විශාල පරිමාණ ව්‍යාපාර ව්‍යවසායයන්) හා පැරණි පද්ධති රාජකාරී |
| ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා | බදු ප්‍රතිපත්ති, ජාත්‍යන්තර කටයුතු හා ලේකම් අංශය |
| ඩබ්.එම්.පී.එන්.බී. වනිගසේකර මහතා | අනුකූලතා සහාය සේවා සහ ප්‍රවර්ධනය |
| එම්.ජේ. ගුණසිරි මහතා | විමර්ශනය |
| ආර්.එම්. ජයසිංහ මහතා | මිල පැවරුම් සහ පර්යේෂණ |
| එම්.එච්. ඩෙන්සිල් මහතා | කලාප II ,VIP සහ RTP ඒකක |
| යූ.බී. වක්කුඹුර මහතා | රඳවා ගැනීමේ බදු, උපයන විට ගෙවීම, මුද්දර ගාස්තු ඔට්ටු හා සූදු බදු සහ ( සරල කරන ලද එකතු කල අගය මත බදු ) |
| ජේ.ඒ.ජී. මහින්දරත්න මහතා | විගණන - මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යවසායයන් |
| බී.ජේ. ජයරත්න මහතා (වැඩ බලන) | නෛතික කටයුතු සහ පැහැර හරිනු ලබන බදු රැස් කිරීම |
| එම්.එල්.එම්. තාහීර් මහතා (වැඩ බලන) | මානව සම්පත් කළමනාකරණය |
| කේ.ඩී.එම්. රත්නකුමාර මහතා (වැඩ බලන) | ප්‍රසම්පාදනය, වත්කම් කළමනාකරණය සහ බදු මෙහෙයුම් සහාය |
| කේ.ඩී.එම්.එන්. ගුණතුංග මහතා (වැඩ බලන) | බදු අනුකූලතා සහ බලාත්මක කිරීම (විශාල පරිමාණ සංස්ථාපිත ව්‍යවසායයන් |
| එස්.එස්.ඩී. වීරසේකර මහතා (වැඩ බලන) | ආපසු ගෙවීම් (විශාල හා මධ්‍ය පරිමාණ සංස්ථාපිත වෙළඳ ව්‍යවසායයන්) |
| ටී. රාජපක්ෂ මහතා (වැඩ බලන) | ස්වාධීන අභ්‍යන්තර කාර්යයන් පාලනය |
| එම්.එස්.එම්. සියාන් මහතා (වැඩ බලන) | පාරිභෝගික ලියාපදිංචිය සහ යාවත්කාලීන කිරීම |
| එම්.ඩී.ජේ.එම්. දේවප්‍රිය මහතා (වැඩ බලන) | තොරතුරු සහ අතුරු මුහුණත් නියෝජ්‍යායතන සහ විශේෂ කාර්යය |
| ටී.ඩී.ජී.එස්. ජයවර්ධන මහත්මිය (වැඩ බලන) | මානව සම්පත් සංවර්ධන හා වෙනස්වීම් කළමනාකරණය |
| ටී.එස්. මෙන්ඩිස් මහත්මිය (වැඩ බලන) | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම (මධ්‍ය පරිමාණ සංස්ථාපිත) |
| ආර්.ඒ.එන්. රාජපක්ෂ මහතා (වැඩ බලන) | තොරතුරු තාක්ෂණ පරිපාලන සහ ගෙවීම් නියාමනය |
| මහින්ද ගුණවීර මහතා (වැඩ බලන) | කලාප I |
| ඩී.යූ.ඒ. ජයවර්ධන මහතා (වැඩ බලන) | කලාප III |
| ඩබ්.ඒ.එස්. චන්ද්‍රසේකර මහත්මිය (වැඩ බලන) | සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන අභියාචනා සහ විරෝධතා |

## වර්ෂය තුළ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ.

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බද්ද | 2017 අංක 14 දරන දේශීය අදායම් පනත |
| එකතු කළ අගය මත බදු (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු, එකතු කළ අගය මත වූ අත්තිකාරම් බදු, විකල්ප එකතු කළ අගය මත බදු ඇතුළත්ව) | 2003 අංක 07, 2004 අංක 13, 2005 අංක 06 සහ 2006 අංක 49 , 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7, 2015 අංක 11, 2016 අංක 20 සහ 2018 අංක 25 දරන පනත් වලින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තුව | 2007 අංක 15, 2008 අංක 11, 2009 අංක16, 2011 අංක 11, 2012 අංක 11, 2013 අංක 6, 2014 අංක 9, 2015 අංක 13, 2017 අංක 3 සහ 2018 අංක 33 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 32, 2011 අංක 10, 2012 අංක 9, 2013 අංක 11, 2014 අංක 10, 2015 අංක 12 , 2016 අංක 21, 2017 අංක 22 සහ 2018 අංක 20 දරන පනත් වලින් සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 10 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| විගමන බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |
| වාහන හිමිකම් බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 2018 අංක 35 දරන මුදල් පනත |

කලින් බලාත්මකව තිබූ දැනට අවලංගු හෝ අහෝසි කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් අය කාර්යයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1991 අංක 52 දරන ජාතිය රැක ගැනීමේ දායක බදු පනත, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් පනත, සංශෝධිත පරිදි |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, සංශෝධිත පරිදි |

## පටුන


**2018 වසර තුළ කාර්ය සාධන සාරාංශය** III
**ප්‍රධාන නිලධාරීන්** VII
**වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු** IX

**පටුන** xi

**කොටස I මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය** 1
**පරිච්ඡේදය 1 මානව සම්පත්** 3
1.1 අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව 5
1.2 උසස් කිරීම් 6
1.3 විශ්‍රාම ගැනීම් 6
1.4 පුහුණු කිරීම් 9

**කොටස II බදු පරිපාලනය** 21
**පරිච්ඡේදය 2 ආදායම් රැස්කිරීම** 23
2.1 බදු ගෙවන්නන් ලියාපදිංචි වීමේ විස්තර 25
2.2 මුළු ආදායම් රැස්කිරීම 25
2.3 මුළු ආදායම් ප්‍රවාහය 28
2.4 පෙර වසර සමඟ ආදායම සැසඳීම 28
2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩ නැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම 29
2.6 ආදායම් රැස් කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම් 30
2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය 30
2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය 31
2.9 ආදායම් බදු රැස් කිරීම 32
2.10 එකතු කළ අගය මත බදු රැස් කිරීම. 34
2.11 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම් 37
2.12 ආර්ථික සේවා ගාස්තුව රැස් කිරීම 39
2.13 උපයන විට ගෙවීමේ බදු රැස් කිරීම 39
2.14 රඳවා ගැනීමේ බදු (පොළිය සහ නිශ්චිත ගාස්තු මත) රැස් කිරීම 39
2.15 ප්‍රාග්ධන ලාභ බද්ද 39
2.16 ඔට්ටු සහ සූදු බදු රැස් කිරීම 40
2.17 වාහන හිමිකම් බද්ද 40
2.18 මුද්දර බදු රැස්කිරීම 40
2.19 ණය ආපසු ගෙවීමේ බද්ද 40
2.20 දේශීය ආදායම් රැස්කිරීම - 2014 සිට 2018 දක්වා (බදු වශයෙන්) 41
**පරිච්ඡේදය 3 වියදම් සහ ඵලදායිතා අනුපාතය** 43
3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2016, 2017 සහ 2018 වර්ෂ සමඟ සැසඳීම 45
3.2 ඵලදායිතා අනුපාතය 46
3.3 අභ්‍යන්තර විගණනය 48
**පරිච්ඡේදය 4 පැහැර හරින ලද බදු** 49
4.1 පැහැර හරින ලද බදු 51
4.2 පැහැර හරින ලද බදු අඩු කිරීම සඳහා සැලසුම් 52
4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම. 53
**පරිච්ඡේදය 5 විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා** 55
5.1 විගණන 57
5.2 අභියාචනා 57
5.3 අය ක්‍රියා මාර්ග 58
5.4 ආපසු ගෙවීම් 58
**පරිච්ඡේදය 6 ජාත්‍යන්තර සබඳතා** 59
6.1 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් 61
6.2 විදේශයන්හි දී අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන් 63
**පරිච්ඡේදය 7 ව්‍යවස්ථා සම්පාදනය** 71
7.1 වසර තුළදී පනවන ලද ව්‍යවස්ථාවන් 73
7.2 අනුමත පුණ්‍යායතන 73

7.3 ගැසට් නිවේදන 73
7.4 අර්ථ නිරූපණ කමිටුව 74
**පරිච්ඡේදය 8 අනෙකුත් කාර්යයන් 77**
8.1 බදු සේවා 79
8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ නිෂ්කාශන සහතික පත් පිළිබඳ විස්තර 80
8.3 මිල පැවරුම් අංශය 80
8.4 සංචාරක එකතු කල අගය මත බදු ආපසු ගෙවීම් ක්‍රමවේදය 80
**පරිච්ඡේදය 9 ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) 81**

## කෙටි යෙදුම්

| | |
|---|---|
| උ.වි.ගෙ. | උපයන විට ගෙවීම් |
| ආ.බ. | ආදායම් බද්ද |
| ප්‍රා.ලා.බ. | ප්‍රාග්ධන ලාභ බද්ද |
| එ.අ.බ. | එකතු කල අගය මත බද්ද |
| ජා.ගො.බ. | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| ආ.සේ.ගා. | ආර්ථික සේවා ගාස්තු |
| ණ.ආ.බ. | ණය ආපසු ගෙවීම් බද්ද |
| ඔ.සූ.බ. | ඔට්ටු හා සූදු බද්ද |
| කො.ග.බ. | කොටස් ගනුදෙනු බද්ද |
| වා.හි.බ. | වාහන හිමිකම් බද්ද |
| වි.බ. | විගමන බද්ද |
| මු.බ. | මුද්දර බද්ද |
| භා.සේ.බ. | භාණ්ඩ හා සේවා බද්ද |
| පි.බ. | පිරිවැටුම් බද්ද |
| ජා.ආ.බ. | ජාතික ආරක්ෂණ බද්ද |
| ඉ.ක.බ. | ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද |
| දේ.ආ.දෙ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| දේ.ආ.කො.ජ. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| දේ.ආ.නි.කො.ජ. | දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| ස.එ.අ.බ. | සරල කරන ලද එකතු කල අගය මත බද්ද |
| ස.ආ.බ. | සමාගම් ආදායම් බද්ද |
| ර.බ. | රඳවාගැනීමේ බද්ද |
| හ.ආ.බ. | හවුල් ව්‍යාපාර ආදායම් බද්ද |
| පු.ආ.බ. | පුද්ගල ආදායම් බද්ද |

# කොටස I

# මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය

# පරිච්ඡේදය 1

# මානව සම්පත්

## 1.1 අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව

2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කරයි.

වගුව **1.1 2018.12.31** දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **දේශීය ආදායම් සේවය** | **1,232** | **1,132** | **100** |
| කොමසාරිස් ජනරාල් * | 1 | 0 | 1 |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 7 | 2 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 10 | 12 |
| කොමසාරිස් | 90 | 75 | 15 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස් / සහකාර කොමසාරිස් | 1,107 | 1,040 | 67 |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී / බදු නිලධාරී ** | 3 | 0 | 3 |
| **අනෙකුත් සේවා** | **1,552** | **1,467** | **87** |
| **ඒකාබද්ධ සේවය** | **1,401** | **1,367** | **34** |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 0 | 1 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 0 | 1 |
| ගණකාධිකාරී | 5 | 5 | - |
| පරිපාලන නිලධාරී | 3 | 3 | |
| භාෂා පරිවර්තක | 9 | 9 | - |
| සංවර්ධන නිලධාරී | 7 | 7 | - |
| පුස්තකාලයාධිපති | 1 | 1 | - |
| සහකාර පුස්තකාලයාධිපති | 1 | - | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 925 | 908 | 17 |
| ප්‍රවාහන නිලධාරී | 1 | - | 1 |
| රියදුරු | 96 | 91 | 5 |
| කාර්යාල සේවක සේවය | 349 | 341 | 8 |
| **තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය** | **132** | **82** | **48** |
| අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 2 | 2 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 6 | 4 | 2 |
| පද්ධති විශ්ලේෂක | 1 | 1 | - |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 18 | 13 | 5 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 105 | 62 | 43 |
| **අනෙකුත්** | **19** | **18** | **5** |
| ඉංජිනේරු | 1 | 1 | - |
| තාක්ෂණ නිලධාරී | 2 | - | 2 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | - | 1 |
| පර්යේෂණ සහකාර | 10 | 10 | - |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 4 | - |
| වඩු කාර්මික | 1 | 1 | - |
| සනීපාරක්ෂක කම්කරු *** | - | 2 | - |
| එකතුව | **2,784** | **2,597** | **187** |

* 2018.12.31 දිනට කොමසාරිස් ජනරාල් තනතුර පුරප්පාඩු වී පැවති අතර, ජ්‍යෙෂ්ඨතම නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයා 2019.04.09 දිනැති කැබිනට් නිවේදනය මත 2019.04.12 දිනැතිව නිකුත් කරන ලද පත්වීම් ලිපිය අනුව 2018.11.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොමසාරිස් ජනරාල් තනතුර සඳහා පත්වීම ලබා දී ඇත.

** දැනට සේවයේ නිරත නොවන බඳු නිලධාරීන් /ජ්‍යෙෂ්ඨ බඳු නිලධාරීන් මත, අනුමත කාර්ය මණ්ඩලයේ සඳහන් කර ඇති තනතුරු අහෝසි කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

*** 2018.01.15 දින මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති පරිදි අනියම් පදනම මත ඇමුණුම සකස් කර ඇත.

## 1.2 උසස් කිරීම්

- ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන් තිදෙනෙකු නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (වැඩ බලන) ධූරයට උසස් කරන ලදි.
- කොමසාරිස්වරුන් හය දෙනෙකු ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩ බලන) ධූරයට උසස් කරන ලදි.
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් (කාර්යයේ නියුතු) දහතුන් දෙනෙකු කොමසාරිස් ධූරයට (වැඩ බලන) ධූරයට උසස් කරන ලදි.

## 1.3 විශ්‍රාම ගැනීම්

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වසර තුළ දී සේවයෙන් විශ්‍රාම ගැනීමට යෙදුණි.

| | |
|---|---|
| • ආර්.එම්.ආර්.ඩබ්. මංචනායක මහත්මිය | කොමසාරිස් ජනරාල් |
| • ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා | කොමසාරිස් ජනරාල් |
| • එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • පී.එල්.එස්. ලියනගේ මහතා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • එම්.එස්.එම් ෆුවාර්ඩ් මහතා | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් |
| • ඩී. රංගල්ල මහතා | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් |

<u>අනෙකුත් විශ්‍රාම ගැනීම්</u>

| | |
|---|---|
| • කොමසාරිස් | 9 |
| • ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | 2 |
| • සහකාර කොමසාරිස්/නියෝජ්‍ය කොමසාරිස් | 14 |
| • ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 |
| • අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන තාක්ෂණ) | 1 |
| • රාජ්‍ය කළකමනාකරණ සහකාර | 23 |
| • කාර්යාල කාර්ය සහායක | 16 |
| • රියදුරු | 8 |

<u>**ආර්.එම්.ආර්.ඩබ්ලිව්. මංචනායක මහත්මිය**</u>

ආර්.එම්.ආර්.ඩබ්ලිව්. මංචනායක මහත්මිය වර්ෂ 1984 දී තක්සේරු නිලධාරිණියක ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූවාය. 2018 නොවැම්බර් 17 දින විශ්‍රාම ගන්නා විට මුදල් අමාත්‍යාංශයේ බදු උපදේශක ධූරය හෙබවූ අතර වර්ෂ 2014.07.29 සිට 2015.03.18 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ධූරය හෙබවූවාය. ඇය RAMIS ව්‍යාපෘතිය ආරම්භයේ දී ව්‍යාපෘති අධ්‍යක්ෂකවරියක ලෙස කටයුතු කළාය. මංචනායක මහත්මිය විවිධ ධාරිතාවන්ගෙන් යුතු ධූරයන් දරමින් වසර 34 ක් මෙම දෙපාර්තමේන්තුවට සිය සේවය කැප කළාය. මෙතුමිය සිය ධූර කාලය තුළ වර්ෂ 2015 දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉහළ මට්ටමේ නිලධාරීන් හට නෙදර්ලන්තයේ පවත්වන ලද බදු කළමනාකරණ වැඩමුළුව, 2014 දී මැලේසියාවේ

පවත්වන ලද e- ආණ්ඩුකරණ පුහුණු වැඩසටහන් පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම, 2013 දී සිංගප්පූරු දේශීය ආදායම් සඳහා යෝජිත සංචාරය, 2013 දී සිංගප්පූරුවේ පැවති e - ආණ්ඩුකරණය සහ වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව, 2010 දී මැලේසියාවේ පැවති බදු ගිවිසුම් සාකච්ඡා කිරීම පිළිබඳ LHDNM-OCED ප්‍රායෝගික වැඩමුළුව, 2007 දී තායිලන්තයේ පැවති 2වන MPM වැඩසටහනේ දෙවන රටවල් අධ්‍යයනය චාරිකාව, 2006 දී ඉන්දියාවේ පැවති බදු ප්‍රතිපත්ති පිළිබඳ වැඩමුළුව යනාදියට සහභාගි වූවාය. තව ද මෙතුමිය 2013 දී පැරීසියේ පවත්වන ලද OECD 18 වන වාර්ෂික බදු ගිවිසුම් රැස්වීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගි වූවාය.

## ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා

ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා තක්සේරුවෙකු ලෙස වර්ෂ 1984 දි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වූයේය. 2018 සැප්තැම්බර් 14 වන දින ඔහු විශ්‍රාම ගන්නා විට මෙම දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් තනතුර හෙබවීය. දේශීය ආදායම් සේවයේ විවිධ තනතුර හොබවමින් දිසානායක මහතා දෙපාර්තමේන්තුව වෙනුවෙන් වසර 34 ක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර තිබුණි. ඔහු 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත හඳුන්වා දීමේ පුරෝගාමියා වූ අතර RAMIS Phase 1 සහ Phase II ක්‍රියාත්මක කිරීමට ද කැපවුණේය. එකී ධූරය දරන කාල වකවානුව තුළ 2018 වසරේදී සිංගප්පූරුවේ පවත්වන ලද “ධරණීය e රාජ්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීම” වැඩමුළුව, 2017 දී එක්සත් රාජධානියේ පවත්වන ලද “නීති සම්පාදන ප්‍රතිපත්ති” වැඩසටහන, 2016 දී මෙක්සිකෝවේ පවත්වන ලද “බදුකරණය සහ තෙල් කර්මාන්තය, පැවරුම් මිල සහ අනෙකුත් බදු අවදානම්” යන වැඩමුළුව, 2016 දී මෙක්සිකෝවේ පවත්වන ලද “බදු දිරි දීමනා ඵලදායී සහ කාර්යක්ෂම ලෙස භාවිත කිරීම” යන වැඩසටහන, 2015 දී නෙදර්ලන්තයේ දී පවත්වන ලද “බදු පරිපාලන” වැඩමුළුව, 2014 දී මැලේසියාවේ පවත්වන ලද e රාජ්‍ය පුහුණු වැඩසටහන සඳහා ගිවිසුම් අත්සන් කිරීම, 2014 දී එක්සත් රාජධානියේ පවත්වන ලද මානව සම්පත් පරිණාමය; මානව සම්පත් සහ සංවිධානය අතර ගැලපීම පිළිබඳ වැඩසටහන, 2014 දී පැරීසියේ දී පවත්වන ලද මිල පැවරුම් පිළිබඳ ගෝලීය සංසදයේ 3 වන වාර්ෂික වැඩමුළුව, 2011 දී සිංගප්පූරුවේ දී බදු අභියාචනය කොමිසම සහ අර්ථකථන කොමිසම විසින් පවත්වන ලද බදු අධිකාරිය පිළිබඳ වැඩසටහන, e රාජ්‍ය සහ වෙනස්වීම් කළමනාකරණ වැඩසටහන, 2010 දී නෙදර්ලන්තයේ පවත්වන ලද ජාත්‍යන්තර බදු කළමනාකරණයේ ප්‍රායෝගික අංශයන් පිළිබඳ වැඩසටහන, 2007 දී ඉන්දියාවේ පවත්වන ලද බදු විගණන සහ කළමනාකරණ වැඩසටහන සහ 2006 දී ඉන්දියාවේ පවත්වන ලද බදු ප්‍රතිපත්ති පිළිබඳ වැඩසටහන යනාදියට සහභාගි විය. තව ද 2017 දී ජපානයේ පවත්වන ලද සංස්ථාපිත ආණ්ඩුකරණය පිළිබඳ OECD ආසියානු වට මේස සාකච්ඡාව, 2012 දී ජපානයේ පවත්වන ලද ආසියානු පැසිපික් රටවල ඉහළ මට්ටම් බදු පිළිබඳ IMF සමුළුව, 2013 දී රුවන්ඩාවේ පවත්වන ලද 34 වන CATA සමුළුව, 2015 දී පැරීසියේ පවත්වන ලද අන්තර් ජාතික 6 වන බදු සංසදය, 2018 දී ලන්ඩනයේ පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීම, ක්‍රොඒෂියාවේ පවත්වන ලද ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා යෝජිත ගිවිසුම් සඳහා මූලික සාකච්ඡාව, ඩෙන්මාර්කය සහ

නෙදර්ලන්තය අතර ඇති ද්විත්ව බදුකරණ ගිවිසුම් සංශෝධනය සඳහා වන සාකච්ඡාව සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගී විය.

**<u>එච්.එම්.ඩී .මුණසිංහ මහත්මිය</u>**

1984 දී තක්සේරු නිලධාරිණියක ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එක් වූ එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් තනතුර දක්වා උසස්වීම් ලැබීය. ඇය 2018 ඔක්තෝබර් 19 වන දින සේවයෙන් විශ්‍රාම ලැබුවාය. මෙතුමිය සිය ධූරය දරන කාල වකවානුව තුළ 2017 දී එක්සත් රාජධානියේ පවත්වන ලද SOE ප්‍රතිසංස්කරණ සහ හවුල්කාරිත්ව සෞභාග්‍ය සහ බදුකරණය හා වර්ධනය සඳහා වූ වැඩමුළුව, බදු හා අපරාධ මත 5 වන OECD සංසදය, බදු අපරාධ විමර්ශන ප්‍රධානීන්ගේ 4 වන සංසදය සහ වැඩමුළුව ද 2017 දී සිංගප්පූරුවේ පවත්වන ලද e - ආණ්ඩුකරණය සහ තොරතුරු තාක්ෂණ පද්ධති කළමනාකරණ පුහුණු වැඩසටහන, 2015 දී නෙදර්ලන්තයේ පවත්වන ලද බදු පරිපාලන වැඩමුළුව, 2013 දී සිංගප්පූරුවේ පවත්වන ලද e - ආණ්ඩුකරණය සහ වෙනස්වීම් කළමනාකරණ වැඩමුළුව, 2011 දී සිංගප්පූරුවේ පවත්වන ලද TFCTN වැඩසටහන, 2007 දී ඉන්දියාවේ පවත්වන ලද බදු ප්‍රතිපත්ති සහ විගණනයේ ප්‍රායෝගික ගැටළු සඳහා වූ වැඩසටහන, 2007 දී ඉන්දියාවේ පවත්වන ලද දියුණු වෙමින් පවතින රටවල බදු පරිපාලනය, 2005 දී එක්සත් රාජධානියේ පවත්වන ලද උසස් කළමනාකරණ විභව වැඩසටහන යනාදියට සහභාගී විය. එසේම මෙතුමිය 2014 දී ටෝකියෝ නුවර පැවත්වූ එකතු කළ අගය මත බදු සඳහා වන OECD ගෝලීය සංසදයේ 2 වන රැස්වීම ද, 2016 දී ටෝකියෝ නුවර පැවැත්වූ OECD ගෝලීය සංසදයේ 5 වන රැස්වීම යනාදියට ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගී වූවාය.

**<u>පී.එල්.එස්. ලියනගේ මහතා</u>**

පී.එල්.එස්. ලියනගේ මහතා වර්ෂ 1985 දී තක්සේරුකරුවෙකු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවයට එක්විය. 2018 නොවැම්බර් මස 11 වන දින සේවයෙන් විශ්‍රාම ගන්නා විට නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් තනතුර හෙබවූ ලියනගේ මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විවිධ ධාරිතාවයන්ගෙන් යුතු ධූරයන් හොබවමින් වසර 33 ක් දෙපාර්තමේන්තුවේ සේවයට කැපවුණි. මෙතුමාගේ සේවා කාලය තුළ වර්ෂ 2018 දී සිංගප්පූරුවේ පැවති ධරණීය e-ආණ්ඩුකරණය විසඳුම් ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුව, 2015 දී නෙදර්ලන්තයේ පැවති බදු කළමනාකරණ වැඩමුළුව, 2014 දී කොරියාවේ පැවති මූල බාදනය සහ ලාභ මාරුවීම් පිළිබඳ වැඩමුළුව, 2013 දී සිංගප්පූරුවේ පැවති e - ආණ්ඩුකරණය සහ වෙනස්වීම් කළමනාකරණය සඳහා වූ FMCP වැඩසටහන, 2007 දී ඉන්දියාවේ පැවති විගණන හා කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන, 2007 දී නෙදර්ලන්තයේ පැවති ජාත්‍යන්තර බදුකරණ මූලධර්ම පිළිබඳ වැඩමුළුව, 2007 දී ඉන්දියාවේ පැවති දියුණු වෙමින් පවතින රටවල බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනයේ ප්‍රායෝගික ගැටළු පිළිබඳ වැඩමුළුව, 2002 දී ඔස්ට්‍රියාවේ පැවති බදු ආකෘති වැඩමුළුව යනා දී විදෙස් රටවල පැවති බදුකරණ වැඩමුළු සහ වැඩසටහන් වලට සහභාගී විය. තව ද 2017 දී පැරිස් නුවර පැවති BEPS

රාමුවේ 2 වන රැස්වීම, 2015 දී පැරිස් නුවර පැවති OECD බදු සංවර්ධන රැස්වීම හා 2011 දී මැලේසියාවේ පැවති පැවරුම් මිල පිළිබඳ ඒකාබද්ධ LHDNM-OCED උසස් සමුළුව යනාදියට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගි විය.

## 1.4 පුහුණු කිරීම්

### 1.4.1 සේවාස්ථ පුහුණුව

විශේෂයෙන් බදුකරණයේ සහ ගිණුම්කරණයේ විශ්ලේෂණ නිපුණතාවයන් දියුණු කිරීමේ සහ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් සහකාර කොමසාරිස්වරුන් සඳහා පුහුණු පාඨමාලාවන් සහ විභාග පවත්වනු ලැබේ. අදාළ ශ්‍රේණීන් සහ උසස්වීම්වල ස්ථිර කිරීම් ලබා ගැනීමටත් රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය දැනුම ලබා දීමත් පෙරදැරි කොට ගෙන, නිලධාරීන්ගේ විවිධාකාර සේවා අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි විවිධ විෂයයන් පිළිබඳ පුහුණුව සලසා දීමට මෙම පාඨමාලාවන් සැලසුම් කර ඇත.

වර්ෂය මුළුල්ලේ පවත්වන ලද පුද්ගල පුහුණු සහ විභාග විස්තර පිළිබඳ පහත පරිදි වේ.

- **සහකාර කොමසරිස්වරුන් සඳහා**

**1.2 වගුව වර්ෂය තුළ පවත්වන ලද පුහුණු පන්ති සහ විභාග**

| පාඨමාලාව / විභාගය | | පුහුණු වූ සංඛ්‍යාව |
|---|---|---|
| දෙපාර්තමේන්තු විභාගය සඳහා සහකාර කොමසාරිස්වරුන් සඳහා පැවැත්වූ පුහුණු පන්ති (පැය 275) | | සිංහල මාධ්‍යය - 379<br>දෙමළ මාධ්‍යය - 14<br>ඉංග්‍රීසි මාධ්‍යය - 21 |
| III වන ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මැයි | සිංහල මාධ්‍යය - 40<br>දෙමළ මාධ්‍යය - 03<br>ඉංග්‍රීසි මාධ්‍යය - 01 |
| III වන ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ජූලි | සිංහල මාධ්‍යය - 09<br>දෙමළ මාධ්‍යය - 00<br>ඉංග්‍රීසි මාධ්‍යය - 01 |
| අළුතින් බඳවා ගත් සහකාර කොමසාරිස්වරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩයිම් විභාගය සඳහා වන විෂයයන්වලට අදාළ දේශන පැවැත්වීම | | සිංහල මාධ්‍යය - 16<br>දෙමළ මාධ්‍යය - 09<br>ඉංග්‍රීසි මාධ්‍යය - 12 |

- **සම්මන්ත්‍රණ සහ වැඩමුළු**

**1:3 වගුව වර්ෂය තුල සංවිධානය කරනු ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු**

| විෂය | වර්ෂය තුළ පැවැත්වූ සම්මන්ත්‍රණ / වැඩමුළු සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|
| දේශීය ආදායම් නිලධාරීන් සඳහා 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතේ ප්‍රායෝගික පැතිකඩ පිළිබඳ සම්මන්ත්‍රණය | 05 | 392 |

| | | |
|---|---|---|
| සමාගම් රෙජිස්ට්‍රාර් රාජකාරී සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන සහ ප්‍රාග්ධන ලාභ පිළිබඳ සම්මන්ත්‍රණය | 02 | 247 |
| දේශීය ආදායම් නිලධාරීන් සඳහා RAMIS වැඩ අයිතම පිළිබඳ පුහුණු සම්මන්ත්‍රණය | 09 | 96 |
| දේශීය ආදායම් නිලධාරීන් සඳහා RAMIS පද්ධතිය යටතේ e- සේවා පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | 87 |
| දේශීය අදායම් නිලධාරීන් සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ජාත්‍යන්තර බදු විධිවිධාන පිළිබඳ සම්මන්ත්‍රණය | 06 | 26 |
| දේශීය ආදායම් නිලධාරීන් සඳහා වැඩමුළුව (අළුතින් බඳවාගත් කණ්ඩායම සඳහා දිශානුයෝජන වැඩසටහන | 09 | 27 |

**1.4.2 විදේශ පුහුණුව**

බදු පරිපාලකයින් ලෙස ඉහළ උසස් මට්ටමේ වෘත්තීය නිපුණත්වයක් පවත්වාගෙන යාමට හැකි වන අයුරින් අනිකුත් රටවල බදු නීතිකරණයේ උසස් පරිපාලනයක් සහ ඉහළ මට්ටමේ පරිචයන් සඳහා නිරාවරණය කිරීමේ අරමුණින් විදේශයන්හි පැවති පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගි කරවීමට පියවර ගන්නා ලදී.

එහි සඳහන් වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගි කර වූ නිලධාරීන් සහ ඔවුන් සහභාගි වූ වැඩසටහන් පහත පරිදි වේ.

**1.4 වගුව - විදෙස් පුහුණු වැඩසටහන සඳහා සහභාගි වීම පිළිබඳ තොරතුරු**

| අංකය | නම සහ තනතුර | වැඩසටහන | රට | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 1 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා කොමසාරිස් ජනරාල් | ධරණීය e- ආණ්ඩුකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 25.02.2018-04.03.2018 |
| 2 | ඒ.එන්. ගුරුගේ මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 3 | පී. රෝහිණී මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | "Belt and Road Initiative " රටවල් වල ජොෂ්ඨ බදු නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණය | චීනය | 25.06.2018-01.07.2018 |
| 4 | ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | "Belt and Road Initiative " රටවල් වල ජොෂ්ඨ බදු නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණය | චීනය | 25.06.2018-01.07.2018 |
| 5 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | "Belt and Road Initiative " රටවල් වල ජොෂ්ඨ බදු නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණය | චීනය | 25.06.2018-01.07.2018 |
| 6 | එම්.ජී. සෝමචන්ද්‍ර | ධරණීය e - ආණ්ඩුකරණ විසඳුම් | සිංගප්පූරුව | 25.02.2018- |

| | | | | |
|---|---|---|---|---|
| | මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | | 04.03.2018 |
| 7 | සී.එච්. වීරසිංහ මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | මානව සම්පත් ඊළඟ පරම්පරාව: රාජ්‍ය අංශය ජනතා කළමනාකරණයට වෙනස් කිරීම | එක්සත් රාජධානිය | 16.06.2018-23.06.2018 |
| 8 | කේ.එස්.බී.ආර්.ඩී.එස්. ස්වර්ණමාලී මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | මානව සම්පත් ඊළඟ පරම්පරාව : රාජ්‍ය අංශය ජනතා කළමනාකරණයට වෙනස් කිරීම | එක්සත් රාජධානිය | 16.06.2018-23.06.2018 |
| 9 | එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | රාජ්‍ය දේපළ ප්‍රතිසංස්කරණය සහ හවුල් සෞභාග්‍ය, බදුකරණය සහ වර්ධනය පිළිබඳ ලෝක බැංකු - KDI ආර්ථිත වැඩමුළුව | දකුණු කොරියාව | 24.03.2018-31.03.2018 |
| 10 | පී.එල්.එස්. ලියනගේ මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ධරණීය e - ආණ්ඩුකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 25.02.2018-04.03.2018 |
| 11 | ඒ.ඒ. දයාරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 12 | ඒ.ඒ. දයාරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 13 | එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ධරණීය e - ආණ්ඩුකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 25.02.2018-04.03.2018 |
| 14 | එම්.ජේ. ගුණසිරි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයනය සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 15 | ඩී. රංගල්ල මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 16 | එම්.එල්.එම්. තාහිර් මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීමය සහතිකය | එක්සත් රාජධානිය | 10.03.2018-17.03.2018 |
| 17 | කේ.ඩී.එම්.එන්. ගුණතුංග මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | උපාය මාර්ගික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | ඕස්ට්‍රේලියාව | 27.02.2018-08.03.2018 |
| 18 | කේ.ඩී.එම්.එන්. ගුණතුංග මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-22.12.2018 |
| 19 | එස්.එස්.ඩී. වීරසේකර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 20 | එස්.එස්.ඩී. වීරසේකර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ව්‍යාපාර විධායකයින් සඳහා ජාත්‍යන්තර වැඩමුළුව | ස්වීඩනය | 23.09.2018-30.09.2018 |
| 21 | නිරූපා අන්ද්‍රාදි මහත්මිය<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී | සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 22 | එන්.ඒ.එච්.කේ. විජේරත්න මහත්මිය<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක | රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනකරුවන් සඳහා කළමනාකරණ ගිණුම් පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | මැලේසියාව | 16..01.2018-23.01.2018 |
| 23 | ඕ.ඩබ්.එන්. ගුණසේකර මහතා<br>කොමසාරිස් | ශ්‍රී ලාංකික වෘත්තිකයින් සඳහා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් | මැලේසියාව | 09.05.2018-13.05.2018 |
| 24 | එන්.එම්.එම්. මිෆ්ලි මහතා<br>කොමසාරිස් | විගණන තාක්ෂණික ක්‍රම පිළිබඳ සතියක කාලයක් පැවැත්වූ පාඨමාලාව | ඉන්දියාව | 09.12.2018-15.12.2018 |
| 25 | ටී.එම්.ජේ.එන්. බණ්ඩාර මහතා<br>කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩිදියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-23.12.2018 |
| 26 | එච්.එම්.සී.එම්. හේරත් මහත්මිය<br>කොමසාරිස් | ශ්‍රී ලාංකික වෘත්තිකයින් සඳහා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් | මැලේසියාව | 09.05.2018-13.05.2018 |
| 27 | එම්.පී.එස්. අබේරත්න මහතා<br>කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ නායකත්ව වැඩසටහන (SLP) | උගන්ඩාව | 20.05.2018-02.06.2018 |
| 28 | එම්.පී.එස්. අබේරත්න මහතා<br>කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ නායකත්ව වැඩසටහන (SLP) | එක්සත් රාජධානිය | 08.04.2018-14.04.2018 |
| 29 | එම්. ගනේෂරාජා මහතා<br>කොමසාරිස් | ආදායම් පරිපාලනය පිළිබඳ IMF SARTTAC ජාත්‍යන්තර මිනුම් සමුළුව | ඉන්දියාව | 08.04.2018-14.04.2018 |
| 30 | එච්.ටී.කේ.එෆ්. පීරිස් මහතා<br>කොමසාරිස් | ශ්‍රී ලංකාව සඳහා පොදු පුද්ගලික හවුල් ව්‍යාපාර අදාළ කර ගැනීම සහ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | චීනය | 03.11.2018-27.11.2018 |
| 31 | යූ.එච්.එම්. අයිරාංගනී මහත්මිය<br>කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-23.12.2018 |
| 32 | එල්.එච්.එන් ජයලත් මහතා<br>කොමසාරිස් | ව්‍යාපාර ව්‍යාපෘති සහ සංවිධාන කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | තායිලන්තය | 04.11.2018-11.11.2018 |
| 33 | යූ.ඩී.එන්. ජයවීර මහතා<br>කොමසාරිස් | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | තායිලන්තය | 15.07.2018-23.07.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 34 | එල්.ඩී.ආර්. ජයසේකර මහතා<br>කොමසාරිස් | ව්‍යාපාර ව්‍යාපෘති සහ සංවිධාන කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | තායිලන්තය | 04.11.2018-<br>11.11.2018 |
| 35 | ඩබ්.එස්. තිලකරත්න මහතා<br>කොමසාරිස් | උපාය මාර්ගික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | ඉන්දුනීසියාව | 09.12.2018-<br>16.12.3018 |
| 36 | ආර්.එස්.ඒ.ඩී.කේ. විජේනාම මෙනවිය<br>කොමසාරිස් | OECD - විදේශ ආයෝජන සඳහා බදු දිරි දීමනා මෙවලම් (MTC – event) | තුර්කිය | 21.11.2018-<br>02.12.2018 |
| 37 | කේ.ජී.පී.කේ. ධර්මවර්ධන මහතා<br>කොමසාරිස් | OECD- වක්‍ර පැවරුම් හෝ වත්කම් පිළිබඳ මෙවලම් (MTC – event) | කොරියාව | 21.10.2018-<br>29.10.2018 |
| 38 | අයි.වී. ජයරත්න මහතා<br>කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-<br>23.12.2018 |
| 39 | එස්. ජයසිංහ මහතා<br>කොමසාරිස් | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | ජපානය | 08.05.2018-<br>16.05.2018 |
| 40 | ජේ.ඩී. දිමන්ත මහතා<br>කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ නායකත්ව වැඩසටහන (SLP) | උගන්ඩාව | 20.05.2018-<br>02.06.2018 |
| 41 | ජේ.ඩී. දිමන්ත මහතා<br>කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ නායකත්ව වැඩසටහන (SLP) | එක්සත් රාජධානිය | 28.07.2018-<br>19.08.2018 |
| 42 | ජේ.එන්. රාජපක්ෂ මෙනවිය<br>කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-<br>23.12.2018 |
| 43 | එස්.ඕ.ඒ.සී.ආර්. නිවුන්හැල්ල මහත්මිය<br>කොමසාරිස් | OECD - විදේශ ආයෝජන සඳහා බදු දිරිදීමනා මෙවලම් (MTC – Event) | තුර්කිය | 21.11.2018-<br>02.12.2018 |
| 44 | ඩබ්.ඩී.ඒ.ඒ. වලිමිනි මහතා<br>කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-<br>23.12.2018 |
| 45 | ආර්. කහවල මහත්මිය<br>කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩිදියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-<br>22.12.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 46 | ඒ.ඒ.ආර්.ඩී. සොයිසා මහත්මිය කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-22.12.2018 |
| 47 | ඩී.එච්.ඩී. සතරසිංහ මහත්මිය කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩිදියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-23.12.2018 |
| 48 | සී.ඒ. බණ්ඩාරනායක මහත්මිය කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-23.12.2018 |
| 49 | ආර්.එම්.එන්.කේ. රත්නායක මහත්මිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | අවදානම් කළමනාකරණ IMF අනුකූලතා පාඨමාලාව | ඉන්දියාව | 22.04.2018-28.04.2018 |
| 50 | ඒ.එම්. නභීල් මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 51 | ආර්. කහවල මහත්මිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | ආදායම් පරිපාලනය පිළිබඳ IMF SARTTAC ජාත්‍යන්තර මිනුම් සමුළුව | ඉන්දියාව | 08.04.2018-14.04.2018 |
| 52 | ඒ.ඒ.ආර්. ද සොයිසා මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-02.04.2018 |
| 53 | ඩී.ඒ.සී. දිසානායක මහත්මිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-22.12.2018 |
| 54 | එස්.අයි. වීරවර්ධන මහත්මිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-02.04.2018 |
| 55 | එස්.අයි. සේනානායක මහත්මිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-23.12.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 56 | එම්.එන්.එම්.ඒ. කාදර් මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලංකාව සඳහා පොදු පුද්ගලික හවුල් ව්‍යාපාර අදාළ කර ගැනීම සහ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | චීනය | 03.11.2018-27.11.2018 |
| 57 | එම්.එන්.එම්.ඒ. කාදර් මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා බදු අනුකූලතාවය වැඩි දියුණු කර දැනුම වර්ධනය කිරීම සඳහා වූ වැඩමුළුව - 2018 | නෙදර්ලන්තය | 15.12.2018-23.12.2018 |
| 58 | ආර්.පී.ඩී.එස්.ඩී. පෙරේරා මහත්මිය ප්‍රධාන ගණකාධිකාරී | දෙවන රටවල් අධ්‍යයන සංචාරය - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ (2 හා 3 වන කණ්ඩායම) නිලධාරීන් සඳහා ධාරිතා ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන | ඉන්දියාව | 09.09.2018-15.09.2018 |
| 59 | ජී.එම්.එස්. චිත්‍රාංගනී මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-02.04.2018 |
| 60 | ඩබ්.එස්. විමලරත්න මහතා නියෝජ්‍ය කොමසාරිස් | අවදානම් කළමනාකරණ IMF අනුකූලතා පාඨමාලාව | ඉන්දියාව | 22.04.2018-28.04.2018 |
| 61 | ජී.ආර්. විමලාවතී මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-02.04.2018 |
| 62 | ඩබ්ලිව්. පස්දුන්කෝරාල මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-02.04.2018 |
| 63 | එස්.සී. අබේසේකර මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-02.04.2018 |
| 64 | ආර්.ඒ.ආර්.පී. රණසිංහ මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 65 | ඩී.එම්. ද එස්. ගමගේ මහතා නියෝජ්‍ය කොමසාරිස් | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | තායිලන්තය | 15.07.2018-23.07.2018 |
| 66 | ජී.ඩී. කරුණාසේන මහතා නියෝජ්‍ය කොමසාරිස් | එක්රැස් කිරීම සහ ශේෂ කළමනාකරණය පිළිබඳ IMF SARTTAC එක් සති පාඨමාලාව (SA 18,49, CAM) | ඉන්දියාව | 11.11.2018-17.11.2018 |
| 67 | එස්.ඩබ්.පී.වයි. සිල්වා මහතා නියෝජ්‍ය කොමසාරිස් | මූල්‍ය විමර්ශන පදනම් වැඩසටහන | ඉතාලිය | 11.03.2018-24.03.2018 |
| 68 | එස්.ඩබ්.පී.වයි. සිල්වා මහතා නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලංකාව සඳහා පොදු පුද්ගලික හවුල් ව්‍යාපාර අදාළ කර ගැනීම සහ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | චීනය | 03.11.2018-27.11.2018 |
| 69 | පී.ජී. ලලිත් මහතා නියෝජ්‍ය කොමසාරිස් | විගණන තාක්ෂණික ක්‍රම පිළිබඳ සතියක පාඨමාලාව | ඉන්දියාව | 09.12.2018-15.12.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 70 | ඒ.ඩබ්.පී. ද සිල්වා මහතා නියෝජ්‍ය කොමසාරිස් | විමර්ශණ සහ බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීම පිළිබඳ නවීන තාක්ෂණ ක්‍රම වැඩමුළුව | ඉන්දියාව | 18.08.2018-26.08.2018 |
| 71 | ඒ.කේ. හෙට්ටිආරච්චි මහතා නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 72 | ඒ.කේ. හෙට්ටිආරච්චි මහතා නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලංකාව සඳහා පොදු පුද්ගලික හවුල් ව්‍යාපාර අදාළ කර ගැනීම සහ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | චීනය | 03.11.2018-27.11.2018 |
| 73 | ඩබ්.ඒ.ඩී.එස්.යූ. වනසිංහ මහතා නියෝජ්‍ය කොමසාරිස් | OECD – බදු පරිපාලනය : බදු පරිපාලනයේ නවීන තාක්ෂණික දිශානතිය (MTC Event) | කොරියා | 11.03.2018-18.03.2018 |
| 74 | එස්.එස්. කොළඹගේ මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 75 | ඩී.එස්.එස්.එස්. දිසානායක මෙනවිය නියෝජ්‍ය කොමසාරිස් | OECD – බදු පරිපාලනය : විශාල ව්‍යාපාර නූතන සංවර්ධනයන් ( MTC event) | චීනය | 13.01.2018-21.01.2018 |
| 76 | ඒ.ජී.ඒ.ජී. ජයමන්ති මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | විගණන තාක්ෂණික ක්‍රම පිළිබඳ සතියක පාඨමාලාව (SA I8.53,AT) | ඉන්දියාව | 09.12.2018-15.12.2018 |
| 77 | එල්.ඒ.එස්.කේ. පෙරේරා මහතා නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 78 | ඊ.කේ.එස්.පී. මනතුංග මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 79 | එම්.පී.ජේ. චන්ද්‍රනිල් මහතා නියෝජ්‍ය කොමසාරිස් | OECD – බදු පරිපාලනය : විශාල ව්‍යාපාර නූතන සංවර්ධනයන් (MTC Event) | චීනය | 13.01.2018-21.01.2018 |
| 80 | එච්.එම්.එල්.බී.හේරත් මහතා නියෝජ්‍ය කොමසාරිස් | විමර්ශණ සහ බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීම පිළිබඳ නවීන තාක්ෂණ ක්‍රම වැඩමුළුව | ඉන්දියාව | 18.08.2018-26.08.2018 |
| 81 | ඩී.ජී. දිසානායක මහතා නියෝජ්‍ය කොමසාරිස් | විමර්ශණ සහ බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීම පිළිබඳ නවීන තාක්ෂණ ක්‍රම වැඩමුළුව | ඉන්දියාව | 18.08.2018-26.08.2018 |
| 82 | එස්.එම්. හේවාගම මහතා නියෝජ්‍ය කොමසාරිස් | OECD – බදු පරිපාලනය : විශාල ව්‍යාපාර නූතන සංවර්ධනයන් (MTC event) | චීනය | 13.01.2018-21.01.2018 |
| 83 | ඩබ්.අයි. බාලරාජ් මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | IMF SARTTAC – එක්රැස් කිරීම සහ හිඟ කළමනාකරණය පිළිබඳ සති පාඨමාලා (SA 18.49 CAM) | ඉන්දියාව | 11.11.2018-17.11.2018 |
| 84 | එම්.එම්.එල්.පී.කේ මාපා මහතා නියෝජ්‍ය කොමසාරිස් | ආදායම් පරිපාලනය පිළිබඳ IMF SARTTAC ජාත්‍යන්තර මිනුම් සමුළුව | ඉන්දියාව | 08.04.2018-14.04.2018 |
| 85 | එම්.එම්.එල්.පී.කේ මාපා මහතා නියෝජ්‍ය කොමසාරිස් | E - වාණිජ්‍යය පිළිබඳ සමුළුව | තායිලන්තය | 26.08.2018-29.08.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 86 | පී.එස්. සුබාර් මෙනවිය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 87 | කේ.එන්.එන්. කහවිදාන මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | පොදු ප්‍රසම්පාදන සහ ගිවිසුම් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව - 2 වන විදෙස් අධ්‍යයන චාරිකාව - ආංශික සපුරාලීම | ජපානය | 09.09.2018-20.09.2018 |
| 88 | පී.එස්. බණ්ඩාර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | අවදානම් කළමනාකරණ IMF අනුකූලතා පාඨමාලාව | ඉන්දියාව | 22.04.2018-28.04.2018 |
| 89 | සී.එස්.එස්. ප්‍රනාන්දු මෙනවිය<br>නියෝජ්‍ය කොමසාරිස් | BEPSI අවම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමුළුව | මෙක්සිකෝ සිටි | 02.06.2018-10.06.2018 |
| 90 | ජේ.එම්.ඩී.පී.එච්. ජයසේකර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 91 | එස්. සර්වේස්වරන් මෙය<br>නියෝජ්‍ය කොමසාරිස් | විදෙස් අධ්‍යයන චාරිකාව - ව්‍යාපාර පරිපාලනය පශ්චාත් උපාධිය | තායිලන්තය | 08.10.2018-14.10.2018 |
| 92 | එන්.සී. විජේවර්ධන මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | මූල්‍ය විමර්ශන පදනම් වැඩසටහන | ඉතාලිය | 11.03.2018-24.03.2018 |
| 93 | ආර්.එම්.එන්. රනවකආරච්චි මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 94 | ආර්.ඊ.එම්. රනවකආරච්චි මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 95 | එච්.එම්.එස්.කේ. ඉලංගසිංහ මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 96 | ඩබ්.ඩී.එන්. චන්ද්‍රලාල් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | OECD – ජාත්‍යන්තර එකතු කළ අගය මත බදු උපදෙස් මාලාව ( MTC event) | කොරියාව | 23.06.2018-01.07.2018 |
| 97 | ආර්.එස්.ටී.එච්. ගමගේ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 98 | ඒ.ඩී.සී.සී. බස්නායක මෙය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | චීනය | 03.11.2018-27.11.2018 |
| 99 | ආර්.ඩී.එම්.එස්. මුහන්දිරම් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 100 | එන්.පී. සේනාධීර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-11.04.2018 |
| 101 | එම්.වයි.එම්. නසීම් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | IMF SARTTAC – එක්රැස් කිරීම සහ හිඟ කළමනාකරණය පිළිබඳ සතියක පාඨමාලාව (SA 18.49 CAM) | ඉන්දියාව | 11.11.2018-17.11.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 102 | ආර්.එන්. සේනානායක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-<br>11.04.2018 |
| 103 | එච්.ඒ.අයි. පෙරේරා මෙය<br>නියෝජ්‍ය කොමසාරිස් | උපාය මාර්ගික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | ඉන්දුනීසියාව | 28.01.2018-<br>04.02.2018 |
| 104 | යූ.පී. විජයහේවා මිය<br>ගණකාධිකාරී | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 05.04.2018-<br>11.04.2018 |
| 105 | ජේ.එම්.යූ.එන්.බී. ජයමහ මහතා<br>සහකාර කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-<br>02.04.2018 |
| 106 | එම්.ආර්.පී. ප්‍රනාන්දු මහතා<br>සහකාර කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-<br>02.04.2018 |
| 107 | එම්.සී. ගුණතිලක මෙනවිය<br>සහකාර කොමසාරිස් | බදු ප්‍රතිපත්ති පිළිබඳ කලාපීය වැඩමුළුව | ඉන්දියාව | 05.08.2018-<br>11.08.2018 |
| 108 | ඩී.පී.එම්. නානායක්කාර මහත්මිය<br>සහකාර කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-<br>02.04.2018 |
| 109 | ආර්.එම්.ඒජී.එස්..පී. සමරකෝන් මහතා<br>සහකාර කොමසාරිස් | PIM ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 25.03.2018-<br>02.04.2018 |
| 110 | යූ.ජී.යූ.එන්.ආර්.කේ. කරුණාරත්න මහතා<br>සහකාර කොමසාරිස් | OECD – බදු පරිපාලනය : බදු පරිපාලනයේ නවීන තාක්ෂණික දිශානතිය ( MTC event) | කොරියාව | 11.03.2018-<br>18.03.2018 |
| 111 | පී.ඒ.ඩී.එස්.කේ. විජයතිලක මෙනවිය<br>සහකාර කොමසාරිස් | අවදානම් කළමනාකරණ IMF අනුකූලතා පාඨමාලාව | ඉන්දියාව | 22.04.2018-<br>28.04.2018 |
| 112 | එම්. රණමුක මෙනවිය<br>සහකාර කොමසාරිස් | අවදානම් කළමනාකරණ IMF අනුකූලතා පාඨමාලාව | ඉන්දියාව | 22.04.2018-<br>28.04.2018 |
| 113 | ඩබ්.ඒ.එල්.එස්. විජේසිංහ මහතා<br>සහකාර කොමසාරිස් | 24 වන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පාඨමාලාව | පාකිස්තානය | 26.08.2018-<br>15.12.2018 |
| 114 | ඩී.එම්.යූ. දිසානායක මහතා<br>සහකාර කොමසාරිස් | IMF SARTTAC – එක්රැස් කිරීම සහ හිඟ කළමනාකරණය පිළිබඳ සතියක පාඨමාලාව (SA 18.49 CAM) | ඉන්දියාව | 11.11.2018-<br>17.11.2018 |
| 115 | ආර්.එම්.ආර්.ඩබ්.එස්.බී. රත්නායක මහතා<br>සහකාර කොමසාරිස් | IMF SARTTAC – එක්රැස් කිරීම සහ හිඟ කළමනාකරණය පිළිබඳ සතියක පාඨමාලාව (SA 18.49 CAM) | ඉන්දියාව | 11.11.2018-<br>17.11.2018 |
| 116 | එම්.පී.ඊ.ආර්. මනමේන්ද්‍ර මෙනවිය<br>සහකාර කොමසාරිස් | IMF SARTTAC – එක්රැස් කිරීම සහ හිඟ කළමනාකරණය පිළිබඳ සතියක පාඨමාලාව (SA 18.49 CAM) | ඉන්දියාව | 11.11.2018-<br>17.11.2018 |

| | | | | |
|---|---|---|---|---|
| 117 | ඩී.සී.රි. ආරච්චිගේ මහත්මිය<br>සහකාර කොමසාරිස් | OECD – ජාත්‍යන්තර එකතුකළ අගයමත බදු උපදෙස් මාලාව (MTC event) | කොරියාව | 23.06.2018-01.07.2018 |
| 118 | එන්.ජී.එල්.එස්. චන්ද්‍රතිලක මහතා<br>සහකාර කොමසාරිස් | OECD – ජාත්‍යන්තර එකතු කළ අගයමත බදු උපදෙස් මාලාව (MTC event) | කොරියාව | 23.06.2018-01.07.2018 |
| 119 | බී.ඩී.එන්.පී. කුමාර මහතා<br>සහකාර කොමසාරිස් | රාජ්‍ය මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධිය (බදු පාඨමාලාව) | ජපානය | 03.09.2018-02.10.2019 |
| 120 | බී.ජී.ඩී.පී. බුලනවැව මහතා<br>සහකාර කොමසාරිස් | සංචාරක එකතු කළ අගය මත ආපසු ගෙවීම පිළිබඳ අධ්‍යයන සංචාරය | සිංගප්පූරුව | 20.03.2018-24.03.2018 |
| 121 | එස්. ත්‍යාකරන් මෙනවිය<br>සහකාර කොමසාරිස් | විදෙස් අධ්‍යයන චාරිකාව - ව්‍යාපාර පරිපාලනය පශ්චාත් උපාධිය | තායිලන්තය | 08.10.2018-14.10.2018 |
| 122 | එස්.ඩී.එස්. ප්‍රනාන්දු මහත්මිය<br>සහකාර කොමසාරිස් | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව 2015/2016 - විදෙස් අධ්‍යයන චාරිකාව | ඉන්දියාව | 24.09.2018-29.09.2018 |

**1.4.3. ලබා දුන් අනෙකුත් විදෙස් පුහුණුවීම්**

(i) පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ (PIM) බදුකරණ ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය සාර්ථකව සම්පූර්ණ කළ නිලධාරීන් පනස් නව දෙනෙකු 2018.11.19 සිට 2018.11.27 දක්වා ඕස්ට්‍රේලියාවේ වැඩසටහනකට සහභාගි වූහ.

# කොටස II

# බදු පරිපාලනය

# පරිච්ඡේදය 2

# ආදායම් රැස්කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ දී රු. 900,348,477,876/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.) විවිධ බදු රැස්කිරීම් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන බදු ගෙවන්නන් සංඛ්‍යාවේ එකතුව 2018.12.31 දින වන විට 1,182,736 ක් ව (රඳවාගැනීමේ බදු ගෙවන්නන් හැර) පැවතිණි.

## 2.1 බදු ගෙවන්නන් ලියාපදිංචි වීමේ විස්තර

වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විවිධ බදුකරණ කටයුතු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව අංක 2.1 වගුවෙහි දක්වා ඇත.

**වගුව 2.1 - 2018.12.31 දිනට ලියාපදිංචි බදු ගෙවන්නන් ගේ සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| ආදායම් බද්ද | | |
| <u>සංස්ථාපිත</u> | | |
| වාසික සමාගම් / නිර්වාසික සමාගම් | 53,260 | |
| <u>සංස්ථාපිත නොවන</u> | | |
| තනි පුද්ගල | 249,759 | |
| හවුල් ව්‍යාපාර | 17,033 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 804 | |
| උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තියන් (2018.03.31) දිනට | 664,828 | |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | **986,684** |
| **අනෙකුත් බදු ගෙවන්නන්** | | |
| ආර්ථික සේවා ගාස්තුව සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 15,587 | |
| එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 26,647 | |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 235 | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 95,127 | |
| මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 235 | |
| ඔට්ටු බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව | 633 | |
| සූදු බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව | 4 | |
| **මුළු අනෙකුත් බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **138,468** |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සේවා යෝජකයන් | 37,230 | |
| පොළිය මත රඳවා ගැනීමේ බදු (රඳවා ගැනීමේ නියෝජිතයන්) | 492 | |
| නිශ්චිත ගාස්තු යටතේ රඳවා ගනීමේ බදු (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවෝ) | 9,768 | |
| මුද්දර බදු (විධිමත් මාසික උපලේඛනගත සැපයුම්කරුවන්) | 9,914 | **57,404** |
| **2018.12.31 දිනට මුළු බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව** | | **1,182,736** |

## 2.2 මුළු ආදායම් රැස්කිරීම

වර්ෂය සඳහා මුළු ආදායම් රැස්කිරීම රුපියල් මිලියන 900,348 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 63,830 ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම ඇතුළුව බදු අනුකූලතාවය වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය

විසින් ගන්නා ලද පුළුල් ක්‍රියාමාර්ගය හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන් මෙම ජයග්‍රහණය සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ ආයකත්වයෙහි ප්‍රතිශතය 46.89% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 87.56% ක අගයක් පෙන්වන අතර ශුද්ධ ආදායම (පළාත් සභාවලට සම්පූර්ණයෙන්ම මාරු කරන ලද මුද්දර ගාස්තු සහ පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ එකතුවෙන් 1/3 ක් හැර) වසර සඳහා ඇස්තමේන්තුවෙන් 84.05% ක් විය.

ආදායම් බද්ද මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2017 දී 27.48% ක් වූ අගය 2018 දී 28.59% දක්වා වැඩිවී ඇති අතර නාමික වශයෙන් ගත් කළ පෙර වර්ෂයේ රුපියල් මිලියන 229,842 ට සාපේක්ෂව 2018 දී රුපියල් මිලියන 257,367 ක් වූ 11.98% ක වැඩිවීමකි. කෙසේවුව ද වාර්ෂික ඇස්තමේන්තුවට සාපේක්ෂව මෙම වසර තුළ ආදායම් බදු එකතු කිරීමේ 17.19% ක හිඟයක් පෙන්නුම් කරයි. මෙම අඩුවීමට හේතුව පාඩු ලබන හෝ ආදායම් බද්දෙන් නිදහස් සෑම පුද්ගලයෙකුටම ආර්ථික සේවා බද්දට යටත් කරමින් 2017 දී සිදු කරන ලද සංශෝධන විය හැක. එම නිසා ආර්ථික සේවා ගාස්තු ගෙවීම, ගෙවිය යුතු ආදායම් බද්දට එරෙහිව ගත හැකි බැවින්, ආදායම් බදු එකතුවෙහි ප්‍රමාණාත්මක අඩුවීමකට හේතු වී ඇත.

එකතු කළ අගය මත බදු රැස් කිරීම පෙර වසරට සාපේක්ෂව 4.04% කින් සහ රුපියන් මිලියන 17,911 කින් වැඩි විය. එසේ වැඩිවීම සඳහා හේතුව වාසික නවාතැන් සැපයීම මත ප්‍රදානය කර තිබූ නිදහස් කිරීම් සහ සමහර භාණ්ඩ ආනයනය හා සැපයීම අවසන් කිරීම විය හැක.

2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත පැනවීම මගින් ප්‍රාග්ධන ලාභ බද්ද හඳුන්වා දුන් අතර එමගින් රුපියල් මිලියන 104 ක් එකතු කර ගැනීමට හැකි විය. තව ද 2018 අංක 35 දරන මුදල් පනත මගින් හඳුන්වා දුන් ණය ආපසු ගෙවීමේ බද්ද මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායමට රුපියල් මිලියන 4,501 ක මුදලක් ලැබුණි. රජයේ නිලධාරීන්ට රජයේ වාහන බලපත්‍ර නිකුත් කිරීම මගින් වාහන ආනයනය ඉහළ ගිය අතර එනිසා පෙර වර්ෂයට සාපේක්ෂව නාමික වටිනාකම රුපියල් මිලියන 541 කින්, එනම් 32.75% කින් වාහන හිමිකම් බදු වර්ධනය වුනි.

අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ග යටතේ ආදායම සැසඳීමක් 2.2 වන වගුවෙහි දක්වා ඇති අතර, එය 01 වන ප්‍රස්ථාරය මගින් නිරූපණය කෙරේ. වසර තුළ මුදල් ප්‍රවාහය 2.3 වන වගුවෙහි දක්වා ඇති අතර එය 02 වන ප්‍රස්ථාරය මගින් නිරූපණය කෙරේ.

| වගුව 2.2 - මුළු ආදායම රැස්කිරීම - 2018 | | | | |
|---|---|---|---|---|
| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව (රු.) (සංශෝධිත) | ආදායම් රැස් කිරීම (රු.) | රැස් කිරීම් ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස් කිරීම මුළු ආදායමේ % ක් ලෙස |
| ආදායම් බද්ද | 310,800,000,000 | 257,366,657,198 | 82.81% | 28.59% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 1,800,000,000 | 104,148,162 | 5.79% | 0.01% |
| එකතු කළ අගය මත බද්ද | 550,000,000,000 | 461,650,624,889 | 83.94% | 51.27% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 87,000,000,000 | 105,690,527,186 | 121.48% | 11.74% |
| ආර්ථික සේවා ගාස්තු | 59,200,000,000 | 52,978,509,494 | 89.49% | 5.88% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 15,000,000,000 | 4,501,166,919 | 30.01% | 0.50% |
| ඔට්ටු හා සූදු බද්ද | 1,000,000,000 | 2,469,578,624 | 246.96% | 0.27% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,800,000,000 | 1,196,346,653 | 66.46% | 0.13% |
| වාහන හිමිකම් බද්ද | 1,650,000,000 | 2,191,685,363 | 132.83% | 0.24% |
| විගමන බද්ද | 15,000,000 | 16,682,442 | 111.22% | 0.00% |
| මුද්දර බද්ද | - | 12,026,430,018 | - | 1.34% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 2,000 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | - | 88,934,025 | - | 0.01% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 40,986,382 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | - | 26,198,521 | - | 0.00% |
| **මුළු ආදායම් රැස්කිරීම** | **1,028,265,000,000** | **900,348,477,876** | **87.56%** | **100.00%** |



## 2.3 මුළු ආදායම් ප්‍රවාහය

| වගුව 2.3 - මුළු ආදායම් ප්‍රවාහය - 2018 | | |
|---|---|---|
| මාසය | ආදායම් රැස් කිරීම් (රු.) | සමුච්චිත ආදායම් රැස් කිරීම් (රු.) |
| ජනවාරි | 78,342,927,072.99 | 78,342,927,072.99 |
| පෙබරවාරි | 79,501,207,317.93 | 157,844,134,390.92 |
| මාර්තු | 60,901,894,239.84 | 218,746,028,630.76 |
| අප්‍රේල් | 77,520,634,503.41 | 296,266,663,134.17 |
| මැයි | 73,074,031,894.04 | 369,340,695,028.21 |
| ජූනි | 55,603,249,413.05 | 424,943,944,441.26 |
| ජූලි | 70,262,920,152.60 | 495,206,864,593.86 |
| අගෝස්තු | 83,254,250,524.70 | 578,461,115,118.56 |
| සැප්තැම්බර් | 81,423,949,309.83 | 659,885,064,428.39 |
| ඔක්තෝබර් | 78,120,615,523.85 | 738,005,679,952.24 |
| නොවැම්බර් | 92,058,464,617.92 | 830,064,144,570.16 |
| දෙසැම්බර් | 63,073,530,997.75 | **893,137,675,567.91** |




## 2.4 පෙර වසර සමඟ ආදායම සැසඳීම

| වගුව 2.4 - පෙර වසර සමග ආදායම සැසඳීම | | | |
|---|---|---|---|
| බදු වර්ගය | **2018** ආදායම් රැස් කිරීම් රු. | **2017** ආදායම් රැස් කිරීම් රු. | රැස් කිරීමේ අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
| ආදායම් බද්ද | 257,366,657,198 | 229,841,806,636 | 11.98% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 104,148,162 | - | - |
| එකතු කළ අගය මත බද්ද | 461,650,624,889 | 443,739,474,789 | 4.04% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 105,690,527,186 | 101,824,565,352 | 3.80% |
| ආර්ථික සේවා ගාස්තු | 52,978,509,494 | 44,719,757,960 | 18.47% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 4,501,166,919 | - | - |
| ඔට්ටු හා සූදු බද්ද | 2,469,578,624 | 1,929,034,608 | 28.02% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,196,346,653 | 1,333,904,584 | -10.31% |
| වාහන හිමිකම් බද්ද | 2,191,685,363 | 1,650,961,000 | 32.75% |
| විගමන බද්ද | 16,682,442 | 4,097,115 | 307.18% |
| මුද්දර බද්ද | 12,026,430,018 | 11,377,134,752 | 5.71% |
| භාණ්ඩ හා සේවා බද්ද | 2,000 | 115,977 | -98.28% |
| පිරිවැටුම් බද්ද | 88,934,025 | 20,753,568 | 328.52% |
| ජාතික ආරක්ෂක බද්ද | 40,986,382 | 15,947,317 | 157.01% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 26,198,521 | 52,769,318 | -50.35% |
| ඉඩම් බද්ද | - | 7,382,158 | -100.00% |
| මුළු ආදායම් රැස්කිරීම | **900,348,477,876** | **836,517,705,134** | **7.63%** |




## 2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩ නැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස් කරනු ලබන පහත සඳහන් බදු දක්වා ඇති ප්‍රතිශතයන්ගෙන් පළාත් සභා වලට මාරුකරන ලදි.

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බදු - මුළු එකතුවෙන් | 33.33% |
| මුද්දර ගාස්තුව - මුළු එකතුවෙන් | 100.00% |

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස් කිරීම් ප්‍රමාණය සහ පළාත් සභාවලට මාරු කරන ලද මුදල 2.5 වන වගුවෙහි දැක්වේ.

| වගුව 2.5 - පළාත් සභාවල බදු ආදායම් රැස් කිරීම් - 2018 | | | |
|---|---|---|---|
| | මුළු රැස්කිරීම් (රු.) | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය (රු.) | % |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 105,690,527,186 | 34,333,142,938 | 33.33% |
| මුද්දර බද්ද | 12,026,430,018 | 12,026,430,018 | 100% |

## 2.6 ආදායම් රැස් කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම්

වසර තුළ රැස් කරන ලද සමස්ත ආදායමෙන් (ආනයන මත එකතු කළ අගය මත බදු, ආනයන මත ජාතිය ගොඩනැගීමේ බදු හා ආනයන මත ආර්ථික සේවා ගාස්තු හැර) ස්ව තක්සේරු පදනම යටතේ ගෙවීම් සමස්ත වටිනාකමට සම්පූර්ණයෙන්ම වාගේ දායකත්වය ලබා දුනි. තව ද, නිලතක්සේරු ආකාරයෙන් ආදායම් රැස් කිරීම මුළු එකතුවෙන් 5% ක් පමණක් විය. වසර තුළ සතුටුදායක මට්ටමකින් ක්‍රියාත්මක කරන ලද විගණන කාර්යයන් තුළින් පෙර වසර සමඟ සසඳා බලන කළ තක්සේරු තුළින් රැස් කිරීම් හි සුළු වැඩි වීමක් පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, ස්වයං තක්සේරු පදනම යටතේ ආදායම් රැස්කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මෙහෙවරෙහි මූලික කොටසක් ලෙස ස්වේච්ඡා අනුකූලතාවය දිරි ගැන්වීම පිණිස ප්‍රයත්නයන් දරන ලදී. මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලද අතර මෙහි සාර්ථකත්වය සඳහා අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සලසන ලදී. මේ පිළිබඳ සංසන්දනාත්මක අගයයන් 2.6 වන වගුවෙහි දක්වා ඇත.

| වගුව 2.6 - ස්වයං තක්සේරු සහ වෙනත් පදනම් මත රැස්කිරීම් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2016 ( රු.'000 ) | | 2017 ( රු.'000 ) | | 2018 ( රු.'000 ) | |
| | ස්වයං තක්සේරු | වෙනත් | ස්වයං තක්සේරු | වෙනත් | ස්වයං තක්සේරු | වෙනත් |
| ආදායම් බද්ද | 220,471,725 | 17,926,886 | 217,555,269 | 12,286,538 | 257,350,666 | 15,991,324 |
| එකතු කළ අගය මත බද්ද (ආනයන මත එ.අ.බ. හැර) | 161,404,285 | 6,710,993 | 269,545,383 | 5,801,137 | 282,477,652 | 9,550,364 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (ආනයන මත ජා.ගො.බ. හැර) | 53,290,159 | 2,313,174 | 69,034,384 | 4,009,688 | 85,523,090 | 2,486,270 |
| ආර්ථික සේවා ගාස්තු (ආනයන මත ආ.සේ.ගා. හැර) | 19,024,527 | 848,146 | 41,834,227 | 725,821 | 50,050,090 | 5,000,577 |
| වෙනත් | 15,732,516 | 24,926 | 18,524,161 | 27,648 | 22,662,101 | 58,045 |
| **එකතුව** | **469,923,212** | **27,824,125** | **616,493,424** | **22,850,832** | **698,063,599** | **33,086,580** |
| සමස්ත ආදායමට % (ආනයන මත එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ආර්ථික සේවා ගාස්තු හැර) | 94% | 6% | 96% | 4% | 95% | 5% |

## 2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය

2018 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 2.7 වන වගුවෙන් පෙන්වන අතර, එම දායකත්වය 04 වන සටහනින් නිරූපණය කෙරේ. 2018 වසරේ රජයේ ආදායම රුපියල් මිලියන 1,919,973 (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2018) දක්වා වැඩි වී ඇත්තේ මුළු රාජ්‍ය ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීම්වල දායකත්වය 46.89% ක් ලෙස වාර්තා කරමිනි.

දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තු ආදායස් රැස්කිරීමේ අගය ප්‍රතිශතයක් ලෙස ගත් විට 2018 වර්ෂය සඳහා 6.23% ක් වේ.

| වගුව **2.7** - ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන*) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදන (රු. මිලියන*) | දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
| 2014 | 1,195,206 | 514,161 | 43.02% | 10,361,151 | 4.96% |
| 2015 | 1,454,878 | 560,422 | 38.52% | 10,950,621 | 5.12% |
| 2016 | 1,686,061 | 641,547 | 38.05% | 11,996,083 | 5.35% |
| 2017 | 1,831,531 | 836,518 | 45.67% | 13,418,287 | 6.23% |
| 2018 | 1,919,973 | 900,348 | 46.89% | 14,449,931 | 6.23% |

මූලාශ්‍රය :- *ශ්‍රී ලංකා මහ බැංකුව (වාර්ෂික වාර්තාව - 2018)




## 2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය

ආදායම් වාර්තා නිසි වේලාවට සැපයීම මගින් සහ ස්වතක්සේරු මත පදනම්ව බදු ගෙවීම සඳහා බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මකව පැවතිණි.

ඒ අනුව, 2017/2018 තක්සේරු වර්ෂය තුළ දී නියමිත දින සංස්ථාපිත නොවන අංශයේ ආදායම් බදු වාර්තා කිරීමේ ප්‍රතිශතය 31% ක් වූ අතර නියමිත දිනයෙන් එක් මාසයක් තුළ එය 38% දක්වා ඉහළ ගොස් ඇත. නියමිත දිනෙන් මාස දෙකක් තුළ සංස්ථාපිත අංශයෙහි අනුකූලතා අනුප්‍රමාණය 42% ක් විය.

සංස්ථාපිත අංශය සම්බන්ධයෙන්, නියමිත දිනට වාර්තා භාර දීමේ අනුකූලතාව 47% ක් වූ අතර, නියමිත දිනෙන් එක් මාසයක් තුළ එය 51% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් තුළ මෙම අංශයෙහි අනුකූලතා අනුප්‍රමාණය 53% ක් විය.

සියලු බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය ස්වතක්සේරු බදු ක්‍රමයක අපේක්ෂිත මට්ටම් නොවුන ද, බොහෝ දුරට අනුකූල වී ඇත. කෙසේ වෙතත්, වාර්තා අනුකූලතාවය සාක්ෂාත් කර ගැනීමෙහි ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවශ්‍ය ක්‍රියාමාර්ග අඛණ්ඩව ගනු ලබයි.

කෙසේ වෙතත්, සැලකිල්ලට බඳුන් කරන වසරේ දී සංස්ථාපිත නොවන ආදායම් බදු හා ජාතිය ගොඩනැගීමේ බද්දෙහි වාර්තා අනුකූලතාවය සැලකිය යුතු අඩුවීමක් දැක ගත හැකිය. e - අයදුම් පද්ධති වාර්තා ඉදිරිපත් කිරීමේ දී එම බදු ගෙවන්නන්ට අවශ්‍ය සහාය ලබා දුන්න ද ඒ පිළිබඳව මනා අවබෝධයක් නොමැති වීම සහ තනි පුද්ගල ආදායම් බදු ලිපි ගොනු ප්‍රමාණය ඉහළ යාම මෙම අඩුවීමට හේතු වූවා විය හැකිය.

2.8 වන වගුවෙන් 2013/2014 සිට 2017/2018 වසර දක්වා නියමිත දිනට සහ නියමිත දින සිට එක් මසක් තුළ ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය පෙන්වයි. අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතා අනුප්‍රමාණයන් 08 වන වගුවෙන් පෙන්වයි.

| වගුව **2.8.1** - ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය 2013/2014 සිට 2017/2018 දක්වා | | | |
|---|---|---|---|
| **තක්සේරු වර්ෂය** | **අංශය** | **නියමිත දිනට අනුකූලතාවය** | **නියමිත දින සිට මාසයක් තුළ අනුකූලතාවය** |
| 2013/2014 | සංස්ථාපිත | 53% | 61% |
| | සංස්ථාපිත නොවන | 42% | 57% |
| 2014/2015 | සංස්ථාපිත | 52% | 58% |
| | සංස්ථාපිත නොවන | 47% | 62% |
| 2015/2016 | සංස්ථාපිත | 30% | 46% |
| | සංස්ථාපිත නොවන | 48% | 59% |
| 2016/2017 | සංස්ථාපිත | 41% | 45% |
| | සංස්ථාපිත නොවන | 45% | 56% |
| 2017/2018 | සංස්ථාපිත | 47% | 51% |
| | සංස්ථාපිත නොවන | 31% | 38% |

| වගුව **2.8.2** - අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතාවය | | | | |
|---|---|---|---|---|
| | **එකතු කළ අගය මත බදු** | **ජාතිය ගොඩනැගීමේ බදු** | **උපයන විට ගෙවීමේ බදු** | |
| වසර 2016 | 71% | 31% | තක්සේරු වර්ෂ 2015/2016 | 57% |
| වසර 2017 | 47% | 21% | තක්සේරු වර්ෂ 2016/2017 | 14% |
| වසර 2018 | 42% | 17% | තක්සේරු වර්ෂ 2017/2018 | 41% |

## 2.9 ආදායම් බදු රැස් කිරීම

සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල ආදායම් බද්ද, ලාභාංශ බදු සහ රඳවාගැනීමේ බදු හරහා 2017 දී එකතු කරගත් බදු ආදායම වන රුපියල් මිලියන 229,842 ට සාපේක්ෂව 2018 වසරේ දී 11.98% කින් වැඩිවී ඇති අතර එය රු. මිලියන 257,367 ක් වේ. වසර තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු ආදායමෙන් සමස්ත ආදායම් බදු එක්රැස් කිරීම 28.59% ක් වන අතර, එය 2017 වසරේ දී 27.48% ක් විය.

### 2.9.1 ආදායම් බදු රැස් කිරීම - ආංශීය වශයෙන් පැහැදිලි කිරීම

මුළු ආදායම් බදු රැස්කිරීම සඳහා සංස්ථාපිත අංශයෙන් ලද දායකත්වය රුපියල් මිලියන 159,133 ක් හෙවත් එකතු කරන ලද මුළු බදු ප්‍රමාණයෙන් 62% ක් විය. සංස්ථාපිත නොවන අංශයේ දායකත්වය රුපියල් මිලියන 98,233 ක් හෙවත් 38% කි.

අංක 2.9.1 වන වගුව මගින් එහි සංයුතිය පෙන්වන අතර අංක 05 වන සටහනෙන් එය නිරූපණය කෙරේ.

| වගුව **2.9.1** - සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් 2018 සහ 2017 | | | | |
|---|---|---|---|---|
| | **2018** | | **2017** | |
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත* | 159,133,186,810 | 62% | 132,871,563,934 | 58% |
| සංස්ථාපිත නොවන** | 98,233,470,388 | 38% | 96,970,242,702 | 42% |
| **එකතුව** | **257,366,657,198** | **100%** | **229,841,806,636** | **100%** |

* 2018 වසරේ රුපියල් මිලියන 21,470 ක සහ 2017 වසරේ රුපියල් මිලියන 17,074 ක ලාභාංශ බදු ඇතුළත්ය.
** පොළී ආදායමෙන් සංස්ථාපිත අංශය විසින් ඉටු කරන ලද සේවාවන්ගෙන් අඩු කරන ලදුව, ප්‍රේෂණය කරන ලද රඳවා ගැනීමේ බදු සහ උපයන විට ගෙවීමේ (PAYE) ක්‍රමය යටතේ සේවා නියුක්තීන් විසින් ගෙවන ලද ආදායම් බදු ඇතුළත් ය.




### 2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය

වසර තුළ රැස් කරන ලද ආදායම් බදුවල ප්‍රභවමය වශයෙන් සංයුතිය (සේවා නියුක්ත සහ වෙනත්) අංක 2.9.2 දරන වගුවෙන් පෙන්නුම් කෙරේ.

| වගුව 2.9.2 - ආදායම් බදු රැස්කිරීම - 2018 | | |
|---|---|---|
| ප්‍රභවය | බදු රැස් කිරීම (රු. මිලියන) | |
| **සේවා නියුක්තිය** | | |
| උ.වි.ගෙ. ක්‍රමය | 40,042.17 | |
| පැහැර හරින ලද බදු සමඟ දණ්ඩන තක්සේරු කිරීම් | 1,342.54 | **41,384.71** |

| **වෙනත්** | | |
|---|---|---|
| ස්වයං තක්සේරු සහ දණ්ඩන සමඟ තක්සේරු කිරීම් | 137,359.64 | |
| පොළී මත රඳවා ගැනීමේ බදු, කුලී සහ නියමිත ගාස්තු | 46,413.76 | |
| ප්‍රභවයේ දී වෙනත් අඩු කිරීම් | 32,132.62 | |
| **දළ බදු රැස් කිරීම** | | **257,290.73** |
| අඩු කළා: ආපසු ගෙවීම් | | (75.93) |
| **ශුද්ධ රැස් කිරීම්** | | **257,366.66** |

රඳවා ගැනීමේ බදු යාන්ත්‍රණය යටතට නොගැනෙන වෙළෙඳාම, ව්‍යාපාර, වෘත්තීය, රැකියාව සහ වෙනත් සේවා මත බදු ඇතුළුව ස්වතක්සේරු හා දණ්ඩන සමඟ තක්සේරු ආකාරයෙන් රැස් කිරීම් එකතුව රුපියල් මිලියන 137,360 ක් වේ.

## 2.10 එකතු කළ අගය මත බදු රැස් කිරීම.

අදාළ වර්ෂය තුළ දී එකතු කළ අගය මත බදු එකතු කිරීම පෙර වර්ෂයේ රුපියල් මිලියන 443,739 ට වඩා 4.04% ක එනම් රුපියල් මිලියන 17,911 ක වර්ධනය වීමකි. කෙසේ වුව ද වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රමාණය වන රුපියල් මිලියන 550,000 ට සාපේක්ෂව මෙම වසරේ ආදායම රුපියල් මිලියන 88,349 ක අඩුවීමක් පෙන්නුම් කරයි. වාර්ෂික නවාතැන් සැපයීම මත සහ අහස්යානා හෝ හෙලිකොප්ටර් යානා, දේශීය පරිභෝජනය සඳහා අච්චකණ්ණාඩි, ලී (ඉරපු), රෙදිපිළි යනාදිය ආනයනය සහ සැපයීම මත ප්‍රදානය කර තිබූ නිදහස් කිරීම අවසන් කිරීම හරහා එකතුකළ අගය මත බදු රැස්කිරීම ඉහළ නැංවුනි. පෙර වසරට සාපේක්ෂව දේශීය සැපයුම් සහ ආනයනයන් සඳහා එකතුකළ අගය මත බදු එකතු කිරීම සැලකිය යුතු වැඩිවීමක් හෝ අඩුවීමක් පෙන්නුම් නොකරයි. වර්ෂය සඳහා එක්රැස් කරගත් සමස්ථ දේශීය එකතු කළ අගය මත ආදායම් බදු රුපියල් මිලියන 282,487 ක් වූ අතර මෙය 2017 වසරේ රුපියල් බිලියන 275,346 ට සාපේක්ෂව 2.59% ක වර්ධනයකි. තව ද පෙර වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ ආනයන මත එකතුකළ අගය මත බදු 6.4% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

එකතු කළ අගය මත ආංශික වශයෙන් දළ රැස්කිරීම, ආපසු ගෙවීම සහ ශුද්ධ රැස් කිරීම 2.10.1 වන වගුවෙන් පෙන්වන අතර, එය 06 වන සටහනෙන් නිරූපණය කෙරේ.

| වගුව **2.10.1** - එකතු කළ අගය මත බදු දළ රැස් කිරීම් සහ ආපසු ගෙවීම් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අංශය | **2017** ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | | **2018** දළ රැස් කිරීම් (රු. මිලියන) | | ආපසු ගෙවීම් | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | |
| නිෂ්පාදන අංශය | | 75,846.31 | | 80,979.04 | 831.18 | | 80,147.86 |
| නිෂ්පාදන නොවන අංශය | | | | | | | |
| - සේවාව | 149,447.26 | | 146,501.05 | | | | |
| - මූල්‍ය සේවාව | 50,052.95 | 199,500.21 | 55,838.29 | 202,339.34 | - | 202,339.34 | 202,339.34 |
| ආනයන | | 168,392.95 | | 179,163.48 | 0.06 | | 179,163.42 |
| එකතුව | | **443,739.47** | | **462,481.86** | **831.24** | | **461,650.62** |




| වගුව 2.10.2 දළ ජාතික නිෂ්පාදනයට එකතු කළ අගය මත බදු දායකත්වය ආංශීය වශයෙන් විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අංශය | 2017 | | 2018 | | දළ දේශීය එ.අ.බ. නිෂ්පාදනයට ප්‍රතිශතය | |
| | ශුද්ධ රැස්කිරීම් (රු.) | % | ශුද්ධ රැස්කිරීම් ( රු.) | % | 2017 | 2018 |
| නිෂ්පාදන අංශය | 75,846,312,316 | 17.09% | 80,147,857,741 | 17.36% | 0.57% | 0.55% |
| නිෂ්පාදන නොවන අංශය | 199,500,207,439 | 44.96% | 202,339,344,169 | 43.83% | 1.49% | 1.40% |
| ආනයන මත | 168,392,955,034 | 37.95% | 179,163,422,979 | 38.81% | 1.25% | 1.24% |
| **එකතුව** | **443,739,474,789** | **100.00%** | **461,650,624,889** | **100.00%** | **3.31%** | 3.19% |

## 2.10.3 කර්මාන්ත වශයෙන් එකතුකළ අගය මත බදු දායකත්වය

සෑම අංශයක් යටතේම වර්ග කල දේශීය සැපයුම් මත එකතුකළ අගය මත බදු පිළිබඳව 2.10.3 වගුවෙන් පෙන්නුම් කර ඇති අතර සමස්ත එකතුකළ අගය මත බදු ආදායමට දක්වා ඇති දායකත්වය එමගින් පිළිබිඹු කරයි.

| වගුව 2.10.3 දළ දේශීය එ.අ.බ - නිෂ්පාදන සහ සේවා අංශ | | | | | |
|---|---|---|---|---|---|
| අංශය | 2016 (රු.මි) | 2017 (රු.මි) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය (%) | 2018 (රු.මි) | පෙර වසර හා සසඳ බලන විට අඩු හෝ වැඩිවීමේ ප්‍රතිශතය |
| බැංකු කටයුතු | 27,770 | 37,150 | 33.78% | 40,117 | 8% |
| රක්ෂණය | 6,371 | 7,313 | 14.79% | 8,180 | 12% |
| හෝටල් සහ ආපනශාලා | 10,566 | 13,668 | 29.36% | 16,596 | 21% |
| ඉදි කිරීම් | 8,230 | 14,542 | 76.70% | 14,908 | 3% |
| විදුලිබලය සහ ගෑස් | 526 | 674 | 28.14% | 718 | 7% |
| ආනයනය | 9,383 | 10,143 | 8.10% | 10,730 | 6% |

| | | | | | |
|---|---|---|---|---|---|
| මුලා | 20,242 | 21,121 | 4.34% | 23,326 | 10% |
| සංනිවේදනය | 7,429 | 19,743 | 165.76% | 17,963 | -9% |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 175 | - | -100.00% | 774 | - |
| බීම-මද්‍යසාර | 1,553 | 18,802 | 1110.69% | 19,937 | 6% |
| වර්ගීකරණය නොකළ සේවා | 39,690 | 82,024 | 106.66% | 74,019 | -10% |
| වර්ගීකරණය නොකළ නිෂ්පාදන | 29,079 | 56,641 | 94.78% | 60,249 | 6% |
| අනෙකුත් | 36,091 | 50,053 | 38.69% | 55,838 | 12% |
| **එකතුව** | **197,105** | **331,874** | **68.37%** | **343,355** | **3%** |

### 2.10.4 2018 වර්ෂයේ එකතුකළ අගය මත බදු සම්බන්ධව සිදු කළ ප්‍රධාන ප්‍රතිපත්ති වෙනස්කම්

i. සමහර ඇඳුම් මත එ.අ.බ. සඳහා කැලි පදනම වෙනස් කිරීම

- රේගුවේ දී සංයුක්ත බදු ලෙස පනවා ඇති එ.අ.බ., ජා.ගො.බ සහ අනෙකුත් බදු මගින් එකතුකළ අගය මත බදු පනත යටතේ යට කලිසම්, මේස්, කෙටි සහ කොට කලිසම් කැලි 6 කට රු. 75/- ක් අය කෙරේ.

ii. සංචාරකයින් සඳහා එ.අ.බ. ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

- ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දිනයක දී ආපසු ගෙවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වනු ඇත.

iii. 2018 අගෝස්තු 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නිදහස් කිරීම් ඉවත් කර ඇති අතර බදු බැඳියාවට යටත් කර ඇත.

- පහත භාණ්ඩ ආනයනය සහ සැපයීම මත ප්‍රදානය කර තිබූ නිදහස් කිරීම, 2018 අගෝස්තු 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කර බදු බැඳියාවට යටත් කර ඇත. (වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නැත්නම්)

(i) අහස්යානා හෝ හෙලිකොප්ටර් යානා

(ii) අච්කණ්නාඩි

(iii) ලී (ඉරපු)

(iv) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනයේ විශේෂයෙන් සඳහන් කර ඇති පරිදි දේශීය පරිභෝජනය සඳහා වන රෙදිපිළි රටට ඇතුල් කිරීමේදී ආනයනය මත අය විය යුතු යම් වෙනත් බදු විශේෂිත අනුපාතයකින් ගෙවිය යුතු සෙස් බද්දට යටත් වේ.

- කල් බදු හෝ කුලී හැර යම් පුද්ගලයෙකු විසින් වාසික නවාතැන් සැපයීම මත ප්‍රදානය කර තිබූ නිදහස් කිරීම, 2018 අගෝස්තු 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කර එකතුකළ අගය මත බදු බැඳියාවට යටත් කර ඇත.

(සටහන: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි වාසික නවාතැන් සැපයීම මත වූ නිදහස් කිරීම, 2019 මාර්තු 31 වන දින දක්වා අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රතිපත්තිමය තීරණයකට එළඹුනි.)

- පහත සඳහන් භාණ්ඩ ආනයනය මත ප්‍රදානය කර තිබූ නිදහස් කිරීම් 2019 ,අගෝස්තු 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කර එකතු කළ අගය මත බදු බැඳියාවට යටත් කර ඇත. (වෙනත් ආකාරයකින් සඳහන් කර නැත්නම් මිස)

(i) රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ හඳුනාගෙන ඇති ගුවන්යානා එන්ජින් සහ ගුවන්යානා අමතර කොටස්

(ii) සිනමාශාලා කැමරා සහ ප්‍රොජෙක්ටර් කොටස් සහ අමතර කොටස්

(iii) ගුවන්යානා උත්තේජක සහ කොටස්

(iv) යම් වර්ගයක කෘෂිකාර්මික නිෂ්පාදන හෝ යම් වර්ගයක ශාක වගා කරන යම් තැනැත්තෙකු විසින් හරිතාගාර සහ බහු උමං සඳහා වන උපකරණ ආනයනය කිරීම සහ හරිතාගාර ඉදිකිරීම් සඳහා වන ද්‍රව්‍ය ආනයන කිරීම

(v) රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති රෙදිපිළි

i. පහත සඳහන් භාණ්ඩ හා සේවා නිදහස් කර ඇත.
- සඳහන් කර ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් භාණ්ඩ ආනයනය කිරීම සහ සැපයීම මත එකතුකළ අගය මත බදු බැඳියාවන් නිදහස් කර ඇත.
   (i) දේශීයව නිෂ්පාදනය කරන ආභරණ, 2016 නොවැම්බර් 22 සිට ඕනෑම කාලසීමාවක් සඳහා
   (ii) රෝහල් කාමර ගාස්තු හැර වෛද්‍ය ආයතනය හෝ ඒ සේවා සැපයීමට වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන් විසින් සපයනු ලබන සියළු සෞඛ්‍ය සේවා (2018 ජූලි 02 වන දින සිට ඕනෑම කාලසීමාවක් සඳහා නිදහස් කිරීම් අදාළ වේ.)
   (iii) 2018 අගෝස්තු 16 වන දින සිට වෘද්ධ සේවා සහ ළමා සත්කාර සේවා
   (iv) 2018 අගෝස්තු 16 වන දින සිට "බාහිර පිවිසුම් ක්‍රියාකරුවන්" විසින් දේශීය විදුලි සංදේශ ක්‍රියාකරුවන් වෙත සපයනු ලබන ජාත්‍ය න්තර විදුලි සංදේශ සේවාවන්
   (v) කල් බදු හෝ කුලී හැර යම් පුදගලයෙකු විසින්, 2019 අප්‍රේ ල් මස 01 වන දින හෝ එදිනට පසු වාසික නවාතැන් සැපයීම සහ එවැනි සැපයීමක්;
   - සහාධිත්‍ය නිවාස ව්‍යාපෘතියක නිවාස ඒකකයක් විකිණීමට අදාල නොවන අවස්ථාවක,
   - එම ව්‍යාපෘතියේ යම් තනි ඒකකයක උපරිම මිල හෝ වෙළඳ පොළ වටිනාකම (දෙකෙන් වඩා වැඩි වටිනාකම) රුපියල් මිලියන පහලොවක් නොඉක්මවන්නා වූ සැපයුම්

ii. මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු නිදහස් කිරීම පහත පරිදි වේ.
- මුදල් නීති පනත යටතේ සාදන ලද නියෝගය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය, 2018 අප්‍රේ ල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා එකතුකල අගය මත බද්දෙන් නිදහස් වේ.

## 2.11 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම්

අදාළ වර්ෂය තුළ මුළු ආදායමට ජාතිය ගෙඩනැගීමේ බදු දායකත්වය රු. මිලියන 105,690 ක් විය. මෙය කලින් වර්ෂයේ රැස්කරන ලද ප්‍රමාණයට වඩා 3.8% කි. මුළු ජාතිය ගොඩනැගීමේ බදු ආදායමෙන් රුපියල් මිලියන 34,333 ක් පළාත් සභාවලට මාරු කරන ලදී.

වගුව **2.11.1** ආංශික වශයෙන් ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම

| අංශය | | නිෂ්පාදනය | සේවා | ආනයන | එකතුව |
|---|---|---|---|---|---|
| ශුද්ධ රැස්කිරීම (රු.) | **2017** | 10,894,310,333 | 38,821,335,524 | 19,319,552,697 | **69,035,198,554** |
| | **2018** | 11,179,474,851 | 40,012,958,409 | 20,164,950,986 | **71,357,384,246** |

2.11.2 වන වගුව මගින් පළාත් සභා වෙත මාරු කිරීමෙන් පසුව, පිළිවෙලින් 2017 සහ 2018 වසරේ ජාතිය ගොඩනැගීමේ ආදායම් ඇස්තමේන්තුව රැස්කරන ලද ආදායම සමග සැසඳීම දක්වා ඇත.

| වගුව 2.11.2 ඇස්තමේන්තු සමග ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම | | |
|---|---|---|
| වර්ෂය | 2018 | 2017 |
| ඇස්තමේන්තු ගත ආදායම (රු.) | 87,000,000,000 | 75,000,000,000 |
| ආදායම් රැස්කිරීම (රු.) | 71,357,384,246 | 69,035,198,554 |
| % | 82% | 92% |




**2.11.1 ජාතිය ගොඩ නැගීමේ බදු රැස්කිරීමට අදාලව 2018 වසරේදී සිදු කරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්**

**(i)** පහත නිදහස් කිරීම් ඉවත් කර බද්දට යටත් කරන ලදී.

- ආනයනය කරනු ලබන තැනැත්තා විසින්ම මත්පැන් විකිණීම මත අදාළ වන වර්තමාන නිදහස් කිරීම ඉවත් කර 2018 අප්‍රේල් මස 01 දින සිට ජාතිය ගොඩනැගීමේ බදු බැදියාවට යටත් කර ඇත.

- මත්පැන් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් මගින් මත්පැන් ආනයනය කිරීම සහ පිරිවැටුම මත අදාළ වන වර්තමාන නිදහස් කිරීම ඉවත් කර ජාතිය ගොඩනැගීමේ බදු බැදියාවට යටත් කර ඇත.

- 2016 නොවැම්බර් 01 වන දිනෙන් පසු ආරම්භවන කාල පරිච්ඡේද සඳහා විදුලි බලය සැපයීම බදු බැදියාවට යටත් කර ඇත. 2017 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා විදුලි බල මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල සැපයීම ජාතිය ගොඩ නැගීමේ බදු බැදියාවට යටත්වේ.

(ii) පහත සඳහන් භාණ්ඩ හා සේවා නිදහස් කර ඇත.

- 2018 අප්‍රේල් මස 01 වන දිනෙන් ආරම්භ වන අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා, නිෂ්පාදකයා විසින් අලෙවි කරනු ලබන අවස්ථාවේ දී දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද පොල්කිරි, පොල්තෙල්, පුන්නක්කු, පොල් තීරු, පොල් කටු හෝ පොල් වතුර.

- 2017 අගෝස්තු මස 01 වන දිනට පෙර ලියා අත්සන් කරනු ලැබූ කොන්ත්‍රාත් ගිවිසුමක් යටතේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු විසින් සපයන සේවා.

- කයාක්ස් ඔරු පැදීම, කයිට් සර්ෆින්ග් සහ කිමිදීම ඇතුළු ජල ක්‍රීඩා සඳහා මෝටර් මගින් ක්‍රියාත්මක නොවන නොවන උපකරණ හා උපාංග ආනයනය කිරීම.

- ආනයනය කරන අවස්ථාවක දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබූවා වූ එල්ලී යන ග්ලයිඩර් පැදීම, බැලූන පැදීම, ඩිරිජිබල්, පැරෂූට් පැදීම සහ පැරාග්ලයිඩර පැදීම ඇතුළු ගුවන් ක්‍රීඩා සඳහා වන බල ගැන්වීම් නොමැති උපකරණ හා උපාංග

- කපා ඔපදමා ප්‍රතිඅපනයන කිරීමේ කාර්යය සඳහා මැණික් ගල් ආනයනය කිරීම.

- කෘෂිකර්මය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ නිර්දේශය මත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද සහ එකී අයිතමයන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන ලද බවට වන කොන්දේසියට යටත්ව, යම් වර්ගයක කෘෂිකාර්මික නිෂ්පාදන හෝ යම් වර්ගයක ශාක වගා කරන යම් තැනැත්තෙකු විසින් හරිතාගාර සහ බහු උමං සඳහා වන උපකරණ ආනයනය කිරීම සහ හරිතාගාර ඉදිකිරීම සඳහා වන ද්‍රව්‍ය ආනයනය කිරීම.

- 2018 අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි, මුදල් නීති පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය මගින් සපයන ලද යම් සේවා.

## 2.12 ආර්ථික සේවා ගාස්තුව රැස් කිරීම

අදාල වර්ෂය තුළ සමස්ථ ආර්ථික සේවා ගාස්තු රුපියල් මිලියන 52,978 ක් වූ අතර එමගින් සමස්ත ආදායමට දායකත්වය 5.88% කි. එය වසර සඳහා ඇස්තමේන්තුවෙන් සියයට 89 කි.

| වගුව 2.12 ආර්ථික සේවා ගාස්තුව රැස් කිරීම | | |
|---|---|---|
| වර්ෂය | 2018 | 2017 |
| ඇස්තමේන්තු ගත ආදායම (රු.) | 59,200,000,000 | 48,000,000,000 |
| ආදායම් රැස් කිරීම (රු.) | 52,978,509,494 | 44,719,757,960 |
| % | 89% | 93% |




## 2.13 උපයන විට ගෙවීමේ බදු රැස් කිරීම

සේවා නියුක්ති ආදායම මත ආදායම් බද්දේ කොටසක් වන උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ වසර තුළ රැස්කරන ලද දළ ආදායම රුපියල් මිලියන 41,385 ක් විය.

## 2.14 රඳවා ගැනීමේ බදු (පොළිය සහ නිශ්චිත ගාස්තු මත) රැස් කිරීම

පොළිය මත රඳවා ගැනීමේ බදු රැස් කිරීම වසර තුළ රුපියල් 35,991,293,842 ක් විය. 2017 අංක 24 දරන නව දේශීය අදායම් පනත යටතේ භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රදානය කර ඇති නිදහස් කිරීම් හේතුවෙන් රුපියල් මිලියන 15,360 ක ආදායම් අඩු වීමක් වාර්තා විය. කෙසේ නමුදු රඳවාගැනීමේ බදු යටතේ විශේෂ ගාස්තුවල විශ්වාසනීයත්වය හේතුවෙන් ගාස්තු මත රඳවාගැනීමේ බදු එක්රැස් කිරීම රුපියල් මිලියන 10,422 ක් වේ.

## 2.15 ප්‍රාග්ධන ලාභ බද්ද

2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත අනුව ප්‍රාග්ධන ලාභ බද්ද හඳුන්වා දුන් අතර, වර්ෂය තුළ රු. 104,148,162 ක ආදායමක් වාර්තා විය. ඇස්තමේන්තුගත වාටිනාකමට සාපේක්ෂව මෙය 5.79% ක අනුපාතයකි.

## 2.16 ඔට්ටු සහ සූදු බදු රැස් කිරීම

වසර තුළ ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම රුපියල් මිලියන 2,470 ක් වූ අතර, එය කලින් වසර හා සසඳා බලන කළ 28.02% ක ඉහළයාමක් පිළිඹිබු කරයි. එසේම අදාළ වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදලට වඩා රුපියල් මිලියන 1,470 ක අතිරික්තයක් විය.

| වගුව 2.16 - ඔට්ටු සහ සූදු බදු රැස් කිරීම | | |
|---|---|---|
| වර්ෂය | 2018 | 2017 |
| ඇස්තමේන්තු ගත ආදායම (රු.) | 1,000,000,000 | 1,800,000,000 |
| ආදායම රැස් කිරීම (රු.) | 2,469,578,624 | 1,929,034,608 |
| % | 247% | 107% |




## 2.17 වාහන හිමිකම් බද්ද

2015 අංක 10 දරන මුදල් පනත යටතේ පනවන ලද බලපත්‍රවල නිදහස් මෝටර් වාහන ආනයනය කිරීම වෙනුවට වාහන හිමිකම් ගාස්තුව 2016 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දෙන ලදි.

මොටර් වාහනයක් ආනයනය කරනු ලබන සෑම තැනැත්තෙකු විසින් ම ණයවර ලිපියක් විවෘත කරන අවස්ථාවේ දී මෙම ගාස්තුව ගෙවිය යුතුය.

අදාළ වර්ෂය තුළ දී, රථවාහන හිමිකම් ගාස්තු වෙන් ආදායම රැස් කිරීම රු. මිලියන 2,192 ක් වූ අතර එය වසර සඳහා කරන ලද ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 542 ක අතිරික්තයක් විය.

## 2.18 මුද්දර බදු රැස්කිරීම

මුද්දර බදු ලෙස රුපියල් මිලියන 12,026 ක් වර්ෂය තුළ දී උත්පාදනය විය. 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර බදු මාරුකිරීම) පනත ප්‍රකාර, මුද්දර බදු රැස් කිරීම් සම්පූර්ණ ප්‍රමාණය අදාළ පළාත් සභාවලට මාරු කරන ලදි. මුද්දර බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අධීක්ෂණ හමු පවත්වන ලදී.

## 2.19 ණය ආපසු ගෙවීමේ බද්ද

2018 අංක 35 දරන මුදල් පනත යටතේ ණය ආපසු ගෙවීමේ බද්ද හඳුන්වා දුන් අතර, එය 2018 ඔක්තෝබර් 31 වන දින සිට බලාත්මක විය. ණය ආපසු ගෙවීමේ බද්ද යටතේ එකතු කරගත් මුදල රු. 4,501,166,919 ක් වන අතර මෙම වසරේ ඇස්තමේන්තු ගත මුදල රු. 15,000,000,000 කි. ඇස්තමේන්තුගත මුදලට සාපේක්ෂව 30.01% ක් පෙන්නුම් කෙරේ.

## 2.20 දේශීය ආදායම් රැස්කිරීම - 2014 සිට 2018 දක්වා (බදු වශයෙන්)

වගුව 2.17 - දේශීය ආදායම් රැස්කිරීම 2014 සිට 2018 දක්වා බදු වශයෙන් විශ්ලේෂණය

| බදු වර්ග | 2014 | | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % |
| ආදායම් බද්ද | 191,960 | 37.33 | 256,435 | 45.76 | 238,399 | 37.16 | 229,842 | 27.48 | 257,367 | 28.59 |
| ආර්ථික සේවා ගාස්තු | 6,155 | 1.2 | 6,148 | 1.1 | 20,458 | 3.19 | 44,720 | 5.35 | 52,978 | 5.88 |
| එකතු කළ අගය මත බද්ද | 237,915 | 46.27 | 214,237 | 38.23 | 283,451 | 44.18 | 443,739 | 53.05 | 461,651 | 51.27 |
| ඔට්ටු හා සූදු බද්ද | 815 | 0.16 | 832 | 0.15 | 1,884 | 0.29 | 1,929 | 0.23 | 2,470 | 0.27 |
| කොටස් හුවමාරු බද්ද | 2,048 | 0.4 | 1,395 | 0.25 | 738 | 0.12 | 1,334 | 0.16 | 1,196 | 0.13 |
| මුද්දර බද්ද | 7,918 | 1.54 | 11,596 | 2.07 | 10,651 | 1.66 | 11,377 | 1.36 | 12,026 | 1.34 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 65,354 | 12.71 | 67,911 | 12.12 | 84,066 | 13.1 | 101,825 | 12.17 | 105,690 | 11.74 |
| වාහන හිමිකම් බද්ද | - | - | - | - | 1,579 | 0.25 | 1,651 | 0.2 | 2,192 | 0.24 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | - | - | - | - | - | - | - | - | 104 | 0.01 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | - | - | - | - | - | - | - | - | 4,501 | 0.5 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 842 | 0.16 | 753 | 0.13 | 259 | 0.04 | 53 | 0.01 | 26 | 0 |
| සමාජ වගකීම් බද්ද | 85 | 0.02 | 20 | 0 | 1 | 0 | - | - | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 3 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 14 | 0 | 12 | 0 | 8 | 0 | 16 | 0 | 41 | 0 |
| පිරිවැටුම් බද්ද | 472 | 0.09 | 16 | 0 | 17 | 0 | 20 | 0 | 89 | 0.01 |
| විගමන බද්ද | - | - | - | - | 11 | 0 | 4 | 0 | 17 | 0 |
| විදේශිකයින් සඳහා කල්බදු දී ඇති ඉඩම් මත බදු | 579 | 0.11 | 1,066 | 0.19 | 23 | 0 | 7 | 0 | - | - |
| **මුළු රැස්කිරීම්** | **514,160** | **100** | **560,422** | **100** | **641,547** | **100** | **836,517** | **100** | **900,348** | **100** |

**සටහන 10**

**2014 සිට 2018 - දක්වා දේශීය ආදායම් රැසකිරීම බදු අනුව විශ්ලේෂණය**



# පරිච්ඡේදය 3

# වියදම් සහ ඵලදායිතා අනුපාතය

වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,134 ක් වූ අතර, පසුගිය වසරේ අගය වූ රුපියල් මිලියන 4,337 සමඟ සසඳා බැලීමේ දී එය 4.68% ක ඉහළයාමක් වාර්තා කරයි. මුළු වියදමෙන් 83.21% ක් හෙවත් රුපියල් මිලියන 3,440 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කරන ලදි. 2017 වසරේ දී, අනුරූපී අගය රුපියල් මිලියන 3,014 ක් විය. වේතන සඳහා වූ වියදම 2017 වසරේ පැවති රුපියල් මිලියන 2,103 ට සාපේක්ෂව 15.7% කින් ඉහළ යාමකි. මුළු වියදමෙන් 58.86% ක් සහ පුනරාවර්තන වියදමෙන් 70.73% කින් සමන්විත වූ මෙම අගය විශාලතම තනි වියදම් අයිතමය විය.

2017 වර්ෂය හා සසඳා බලන කළ වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 47.51% කින් අඩු වීමක් වාර්තා කරන ලද අතර එය රුපියල් මිලියන 694 ක් විය. මෙම අගය 2017 වසරේ දී රුපියල් මිලියන 1,322 ක් විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු වියදමෙන් 16.79% ක් ප්‍රාග්ධන වියදම් නියෝජනය කරයි.

අදාළ වර්ෂය තුළ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සඳහා කරන ලද ආයෝජනය රුපියල් මිලියන 289 ක් වන අතර 2018 දී RAMIS ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සීමා කළ හෙයින් 73% ක RAMIS වියදමෙහි අඩුවීමක් පෙන්නුම් කරන ලදී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පිටස්තර පුද්ගලයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හේතුවෙන් නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂය තුළ දරන ලද වියදම රුපියල් මිලියන 133 ක් විය.

## 3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2016, 2017 සහ 2018 වර්ෂ සමඟ සැසඳීම

**වගුව 3.1 මුළු වියදම් - 2016, 2017 සහ 2018**

| විස්තරය | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|
| | ( රු. '000 ) | % | ( රු. '000 ) | % | ( රු. '000 ) | % |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පඩිනඩි | 1,984,484 | 48.87% | 2,103,065 | 48.49% | 2,433,263 | 58.86% |
| ගමන් වියදම් | 33,172 | 0.82% | 122,367 | 2.82% | 37,823 | 0.91% |
| සැපයුම් | 107,990 | 2.66% | 108,890 | 2.51% | 116,243 | 2.81% |
| නඩත්තු | 52,562 | 1.29% | 60,722 | 1.40% | 72,648 | 1.76% |
| කොන්ත්‍රාත් සේවා | 624,199 | 15.37% | 579,474 | 13.36% | 737,221 | 17.83% |
| පැවරුම් | 38,752 | 0.95% | 40,088 | 0.92% | 42,964 | 1.04% |
| **උප එකතුව** | **2,841,159** | **69.96%** | **3,014,606** | **69.51%** | **3,440,162** | **83.21%** |
| <u>ප්‍රාග්ධන වියදම්</u> | | | | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩි දියුණු කිරීම් | 29,425 | 0.72% | 61,083 | 1.41% | 52,668 | 1.27% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 27,130 | 0.67% | 53,439 | 1.23% | 38,900 | 0.94% |
| ධාරිතා ගොඩනැගීම | 55,031 | 1.36% | 127,817 | 2.95% | 180,923 | 4.38% |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 1,108,385 | 27.29% | 1,067,931 | 24.62% | 288,834 | 6.99% |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | - | - | 12,290 | 0.28% | 132,813 | 3.21% |
| **උප එකතුව** | **1,219,971** | **30.04%** | **1,322,560** | **30.49%** | **694,138** | **16.79%** |
| **මුළු එකතුව** | **4,061,130** | **100.00%** | **4,337,166** | **100.00%** | **4,134,300** | **100.00%** |







## 3.2 ඵලදායිතා අනුපාතය

2018 වසරේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,134.3 ක් වූ අතර, රැස් කළ ආදායම රුපියල් මිලියන 900,348.47 ක් විය. එබැවින් ඵලදායිතා අනුපාතය (එනම් වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස් කළ ආදායම) 217:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රුපියල් 100 ක් රැස් කිරීමේ පිරිවැය, ශත 46 ක් ලෙස ගණනය කෙරේ. රැස් කිරීමේ පිරිවැය ආනයනයේ දී රැස් කරන ලද එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු හැර දෙපාර්තමේනතුවේ ආදායම් රැස්කිරීමේ පිරිවැය රුපියල් 100 ක් සඳහා ශත 58 ක් විය. (පෙර වර්ෂයේ දී අනුරූපී අගයන් පිළිවෙලින් ශත 52 සහ ශත 67 ක් විය.)

2016 - 2018 වසර දක්වා ආදායම් රැස් කිරීම, මුළු වියදම් සහ රැස් කිරීමේ පිරිවැයෙහි වර්ගීකරණය 3.2 වන වගුවෙහි දැක්වේ.

| වගුව 3.2 - ආදායම් රැස් කිරීම, මුළු වියදම හා රැස්කිරීමේ පිරිවැය (රුපියල් මිලියන) | | | |
|---|---|---|---|
| විස්තරය | **2016** | **2017** | **2018** |
| ආදායම් රැස් කිරීම | | | |
| ආදායම් බද්ද | 238,398.61 | 229,841.81 | 257,366.66 |
| ආර්ථික සේවා ගාස්තුව | 20,458.17 | 44,719.76 | 52,978.51 |
| එකතු කළ අගය මත බද්ද | 283,451.51 | 443,739.47 | 461,650.62 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 84,066.53 | 101,824.56 | 105,690.53 |
| ඔට්ටු හා සූදු බද්ද | 1,884.50 | 1,929.03 | 2,469.58 |
| කොටස් ගනුදෙනු බද්ද | 737.66 | 1,333.90 | 1,196.35 |
| වාහන හිමිකම් බද්ද | 1,579.13 | 1,650.96 | 2,191.68 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | - | - | 4,501.17 |
| විගමන බද්ද | 11.05 | 4.1 | 16.68 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | - | - | 104.14 |
| සමාජ වගකීම් බද්ද | 0.84 | - | - |
| පිරිවැටුම් බද්ද | 16.64 | 20.75 | 88.93 |
| මුද්දර බද්ද | 10,650.97 | 11,377.13 | 12,026.43 |
| භාණ්ඩ හා සේවා බද්ද | 1.59 | 0.12 | - |
| ජාතික ආරක්ෂක බද්ද | 8.09 | 15.95 | 40.99 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 258.80 | 52.77 | 26.2 |
| ඉඩම් බද්ද | 22.66 | 7.38 | - |
| **මුළු එකතුව** | **641,546.75** | **836,517.69** | **900,348.47** |
| වියදම් | | | |
| පුනරාවර්තන වියදම් | | | |
| පඩිනඩි | 1,984.48 | 2,103.06 | 2,433.27 |
| ගමන් වියදම් | 33.17 | 122.37 | 37.82 |
| සැපයුම් හා උපකරණ | 107.99 | 108.89 | 116.24 |
| නඩත්තු හා අලුත්වැඩියා | 52.56 | 60.72 | 72.65 |
| කොන්ත්‍රාත් සේවා | 624.20 | 579.47 | 737.22 |
| මාරු කිරීම් | 38.75 | 40.09 | 42.96 |
| ප්‍රාග්ධන වියදම් | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් | 29.42 | 61.08 | 52.67 |
| අත්පත් කර ගැනීම් | 27.13 | 53.44 | 38.90 |
| ධාරිතා ගොඩනැංවීම | 55.03 | 127.82 | 180.92 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 1,108.39 | 1,067.93 | 288.84 |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | - | 12.29 | 132.81 |
| **මුළු වියදම** | **4,061.12** | **4,337.16** | **4,134.30** |
| | | | |
| රු. 100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.63** | **0.52** | **0.46** |
| ආනයන මත එකතු කළ අගය මත බදු ,ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තු හැර රු.100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.80** | **0.67** | **0.58** |

## 3.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන ලද විගණන වලට සියලු වියදම් එනම්, දෛනික වාහන ධාවන සටහන් (ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වා ගෙන යනු ලබන), පඩි ලැයිස්තු, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා, මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීම ආදිය ද ඇතුළත් විය. තවද, මෙයට අතිරේක වශයෙන්, අගරු චෙක්පත්වල මුදල් අය කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග, එකතු ල අගය මත බදු සහ ආදායම් බදු වලින් ආපසු ගෙවීම්, අග්‍රිම ගිණුම් සහ උප අග්‍රිම රෙජිස්ටර් පරීක්ෂා කිරීම, ප්‍රාදේශීය කාර්යාල පරීක්ෂා කිරීම යනාදිය ද අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

# පරිච්ඡේදය 4

# පැහැර හරින ලද බදු

## 4.1 පැහැර හරින ලද බදු

4 .1 වන වගුවෙන් 2017.12.31 දිනට පැහැර හරින ලද බදු ප්‍රමාණය, අත්හිටවූ බදු ප්‍රමාණය, දණ්ඩන සහ රැස් කර ගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණය නිරූපණය කරයි.

වගුව 4 .1 . පැහැර හරින ලද බදු විශ්ලේෂණය - 2017.12.31 දිනට

| බදු වර්ගය | පැහැර හරින ලද දළ බද්ද (රු.) | දඩ මුදල (රු.) | දණ්ඩන හැර මතභේදයට තුඩු දුන් බදු (රු.) | මතභේදයට තුඩු දුන් බදු වලට අදාළ දණ්ඩන (රු.) | රැස් කළ හැකි බදු (රු.) | රැස් කළ හැකි දණ්ඩන (රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 119,540,104,679 | 72,939,998,624 | 112,000,816,315 | 66,915,465,836 | 7,539,288,364 | 6,024,532,788 |
| ආදායම් බද්ද මත අධිභාරය | 258,960,780 | 165,710,940 | 255,044,714 | 163,763,121 | 3,916,066 | 1,947,819 |
| ආදායම් බද්ද (පොළිය මත රඳවා ගැනීමේ බදු) | 1,508,265,061 | 688,812,235 | 214,441,597 | 91,808,201 | 1,293,823,464 | 597,004,034 |
| එකතු කළ අගය මත බද්ද | 56,966,946,611 | 41,619,931,025 | 42,597,804,741 | 32,783,899,407 | 14,369,141,870 | 8,836,031,618 |
| එකතු කළ අගය මත බද්ද (මූල්‍ය සේවා) | 7,643,997,409 | 4,153,954,002 | 7,609,732,579 | 4,118,186,802 | 34,264,830 | 35,767,200 |
| ආර්ථික සේවා ගාස්තු | 3,849,895,152 | 3,319,060,447 | 3,120,031,452 | 2,799,561,786 | 729,863,700 | 519,498,661 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 11,404,952,534 | 8,063,787,790 | 5,297,328,168 | 4,419,749,404 | 6,107,624,366 | 3,644,038,386 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (මූල්‍ය සේවා) | 391,312,502 | 190,590,856 | 383,119,329 | 186,520,478 | 8,193,173 | 4,070,378 |
| මුද්දර බද්ද | 9,732,724 | 4,866,362 | - | - | 9,732,724 | 4,866,362 |
| හර බද්ද | 2,215,581,368 | - | 2,215,581,368 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 1,722,835,502 | 863,949,677 | 1,722,835,502 | 863,949,677 | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 934,955,433 | 1,011,928,821 | 934,955,433 | 1,011,928,821 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 1,267,057,545 | 529,265,383 | 1,267,057,545 | 529,265,383 | - | - |
| ජාතිය රැක නැගීමේ දායක මුදල | 14,286,141 | 4,471,485 | 14,286,141 | 4,471,485 | - | - |
| ධන බද්ද | 849,952 | 403,652 | 849,952 | 403,652 | - | - |
| ත්‍යාග බද්ද | 2,409 | 1,204 | 2,409 | 1,204 | - | - |
| සමාජ වගකීම් බද්ද | 1,848,479 | 146,995 | 1,848,424 | 146,995 | 55 | - |
| සමථයකට පත්වන දණ්ඩන | - | 252,837,716 | - | 137,202,448 | - | 115 635 268 |
| එකතුව | **207,731,584,281** | **133,809,717,214** | **177,635,735,669** | **114,026,324,700** | **30,095,848,612** | **19,783,392,514** |

සටහන:

- අදාළ එක් එක් බදු වර්ගය යටතේ පවත්නා වූ සමුච්චිත ශේෂ ප්‍රමාණය මුළු හිඟබදු ප්‍රමාණය මගින් නියෝජනය කෙරේ. කෙසේ වෙතත්, ඉහත වර්ගීකරණය කර ඇති පරිදි නොගෙවූ බදු ඒ ස්වරූපයෙන් ම සම්පූර්ණයෙන් ම හිඟව නොපවතී.

- කවර වූ හේතුවක් මත තක්සේරුවක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී (බදු ගෙවන්නා විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, වාර්තාව පදනම් කොට ගෙන බදු නොගෙවීම, සාවද්‍ය වාර්තා හෝ ප්‍රකාශ ඉදිරිපත් කිරීම යනාදී) නොගෙවූ හෝ හිඟ මුදලක් උද්ගත වේ. නියමිත දිනට බදු නොගෙවීම වෙනුවෙන් දණ්ඩන මුදල සාමාන්‍යයෙන් 10% ක් වන අතර, ආදායම් බදු සම්බන්ධයෙන් එය 50% ක බදු ප්‍රමාණයක් කරා ළඟා වනතුරු නොගෙවන ලද සෑම මාසයක් සඳහාම 2% ක ප්‍රමාණයක් සහ එකතු කල අගය මත බදු සම්බන්ධයෙන් 100% ක ප්‍රමාණයක් වේ.

- තක්සේරු කිරීම්වලට එරෙහිව බදු ගෙවන්නන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී සහ ඉන් අනතුරුව ඔවුන් විසින් තම අභියාචනා අයිතිවාසිකම් සඳහා ඉල්ලුම් කර ඇති පරිදි නිරාකරණය කිරීම සිදු කරනු ලබන විට ඇතැම් නඩු අවස්ථා සම්බන්ධයෙන් ඉහළ අභියාචනා මට්ටම් දක්වා (අභියාචනා කොමිසම, අභියාචනාධිකරණය ආදිය) අදාළ බදු පැහැර හරින ලද බදු ලෙස සලකනු ලැබේ. මෙම බදු ප්‍රමාණයන් මතභේදයට තුඩු දුන් බදු, දණ්ඩන හෝ අත්හිටවූ බදු ලෙස වර්ගීකරණය කළ හැකි ය. අභියාචනා විසඳීමේ දී එකතු කරන ලද දණ්ඩන සමඟ තක්සේරු කළ යම් අතිරේක ප්‍රමාණය විසර්ජනය කළ යුතු වේ.

- රැස් කර ගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණය රැස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## 4.2 පැහැර හරින ලද බදු අඩු කිරීම සඳහා සැලසුම්

හිඟ බදු අය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සහ පියවරයන්ම අදාළ ප්‍රඥප්තීන් හි දැක්වේ. තක්සේරු නිකුත් කිරීමෙන් එවැනි පියවර අඛණ්ඩව ගනු ලැබුව ද, සැලකිය යුතු බදු ප්‍රමාණයක් හිඟව පවත්නා බව ද දැක ගත හැකිය.

2010 අංක 16 දරන හිඟ බදු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි හිඟ බදු අය කර ගැනීමේ අංශය විසින් අදාළ හිඟ බදු වාර්තා පිළියෙල කර ඇති අතර, අතිරේක අධිකාරිත්වයක් සහිත ඵලදායී ලෙස බදු ආපසු අය කර ගැනීමේ කටයුතු තුළින් වඩාත් යහපත් ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. (යම් යම් අවස්ථාවන්හි දී හිඟ බදු අය කර ගැනීම සඳහා මෙන්ම ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිමත් සහ වේගවත් ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා වන පනතකි.)

## 4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම.

